9093

22045

22045

මිළ රු. 5/-

මුද්‍රණය:
සීමාසහිත එච්.ඩබ්ලිව් කේව් සහ සමාගම
141, ඩී.ආර්. විජයවර්ධන මාවත කොළඹ 10.

# ගොවි අයිතිය

## ගොවි අයිතීන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය



ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ

ප්‍රකාශනයකි

1993

පුස්තකාලය
LIBRARY
ගො. ප. පු. ආ.
ARTI

2010/04
06
2009/06

# ගොවි අයිතිය

## ගොවි අයිතීන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය

පුස්තකාලය
1993 ඔක් 28
1522.
කොළඹ

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රකාශනයකි

1993

22045
22045
පුස්තකාලය
LIBRARY
ගො. ප. පු. ආ.
ARTI

# බහු ජාතික බලවේග සහ ගොවි අයිතීන්

ගොවි අයිතීන් පිළිබඳ මෙම ප්‍රඥප්තිය එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ සාමාජික රටවල් විසින් කරන ලද්දේ 1979 දීය. අද දින ගොවි ජනතාව සතු අයිතීන්, විශේෂයෙන්ම මහ පොළොව හා ජලය සහ බැඳී ඇති ඔවුන්ගේ ඓතිහාසික උරුමයන් පිළිබඳ කතා කළ යුතුව තිබෙන්නේ සුවිශේෂ සමාජ-ආර්ථික-දේශපාලන පරිසරයක් පසුබිම් කොට ගෙනයි.

"බ්‍රෙටන් වුඩ්ස් ආයතන" වශයෙන් හඳුන්වනු ලබන ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව පෙරදැරිව, ලෝක ආර්ථිකය පාලනය කරන බහු ජාතික සමාගම් විසින්, අවිනිශ්චිත භාවය සහ හදිසි බිඳවැටීම් එහි ප්‍රධාන ලක්ෂණයන් වූ ජාත්‍යන්තර වෙළඳ පොලකට රටක ආර්ථිකය ගැට ගසා, ඒ හරහා එම රටේ ජනතාව, විශේෂයෙන්ම එම ආර්ථිකය තුල පීඩා විඳින ජනතාව, වහල්කමට තල්ලු කිරීමේ ඉතාමත් සූක්ෂමව, සැලසුම් සහගතව ක්‍රියාත්මක වන කුමන්ත්‍රණයන් හමුවේ, ඒ තත්ත්වයන් ජයග්‍රහණය කිරීමෙහිලා එම ජනතාවගේ ආහාර ආරක්ෂිතය තහවුරු කිරීම ඉතාමත් වැදගත් වේ. මෙම කාර්‍යයේදී ගොවියාට හිමිවන්නේ සුවිශේෂවූත්, තීරණාත්මක වූත් වගකීමකි. ඒ අනුව ඌන සංවර්ධිත රටක් වන ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියෙහි නියමුවා ගොවියා යැයි ඇතැමෙක් තර්ක කල හොත්, එහි යම්කිසි සත්‍යයක් ගැබ්ව ඇති බව පැහැදිලිය. මෙය දිගී විවාද වලට ලක්වූ සංකල්පයක් බැවින් "සංවර්ධනය" පිළිබඳ යමක් කෙටියෙන් සඳහන් කිරීම උචිතය.

"සංවර්ධනය" යනුවෙන් අපට හඳුන්වා දී ඇත්තේ අපේ සංස්කෘතික උරුමයනට පරිබාහිර වූ විදේශ කාර්මික ආර්ථික පරිසර තුල බිහිවූ ක්‍රියාදාමයන්ය. අද වඩාත්ම පැහැදිලි සත්‍යය නම් අපේ ගොවි පරපුර මහා පොළොව මතින් උදුරා දමා කාර්මීකරණයේ රුදුරු දැති රෝදයට යට කලත් අපට ඉහත කී "ලෝක වෙළඳපොළ" හා අවිවෘතව පවතින ලෝක ආර්ථිකය මාර්ගයෙන් අත්පත් කරගත හැකි දියුණුවක් නැති බවයි. කාර්මීකරණයේ සුරපුර වෙත අපට යා නොහැකි බවයි. අපේ රටේ සරුපස මත ඉදිවෙන සුරපුර රත්වන් කරලින් මිස අන් කිසි දෙයකින් නිර්මාණය කල නොහැක. බ්‍රෙටන් වුඩ්ස් අයතන වල නිර්දේශය අත්කිසිවක් නොව, අවුරුදු දස දහස් ගණනක් සහල හා බැඳි අපේ සංස්කෘතික හර පද්ධති බිඳ දමා, බත් වෙනුවට පාන් කන, පරගැති, විජාතිකයින් මත යැපෙන, ඔවුන්ට ආවඩන, පරපුරක් ගොඩනගා නැවතත් අපව වහල් යටත් විජිත යුගයකට දක්කාගෙන යාමය. "තුන්වන ලෝකයේ" ජල සම්පත් හා ඉඩම් මෙන්ම බීජ හා ජාන වර්ගද බහුජාතික සමාගම් සහ මහ පරිමාන කෘෂි ව්‍යාපෘති විසින් කොල්ල කෑම සඳහා විවෘත කිරීම පිණිස සුදුසු පරිසරයක් සකස් කර දීම මොවුන්ගේ අරමුණ වී ඇත.

තීරුබදු හා වෙළඳම පිළිබඳ පොදු සම්මුතිය (GATT) "දියුණු" යැයි කියාගන්නා බටහිර රටවල් අතලොස්සක් "තුන්වන ලෝකයේ" රටවල් සමග නොයෙක් ගිවිසුම් විටින් විට සම්මත කරගන්නේ ඔවුන්ගේ ආර්ථික හා ආයුධ බලය යොදවමින් බව නොරහසකි. නුදුරු අනාගතයේදී සම්මත කිරීමට බලාපොරොත්තු වන, දැනුදු ඉතාම සූක්ෂමව, රහසින් යම් යම් රටවල් වල ක්‍රියාත්මක වන, "වෙළඳාමට සම්බන්ධ බුද්ධිමය දේපල පිළිබඳ අයිතීන්" පිළිබඳ ගිවිසුමකින් ලංකාව ඇතුළු තුන්වන ලෝකයේ රටවල් වල ගොවීන්ගේ අයිතිවාසිකම් සෘජුවම උල්ලංඝනය කිරීමට මොවුහු බලාපොරොත්තු වේ.

දශකයකට අධික කාලයකට පසුව වුවද මෙම ප්‍රතිඥාව සිංහලයට නැංවෙන්නේ ඉහත සඳහන් තත්ත්වයන් අභිමුවයි. පමාවී හෝ මෙම ප්‍රකාශනය ලංකාවේ ගොවි ජනතාවට පිරිනැමෙන්නේ එම ප්‍රඥප්තිය මගින් තහවුරු කරන ලද අයිතීන් බලවත් තර්ජනයන්ට මුහුණ පා සිටින අවධියකය. නා නා මුහුණු වරින් අපගේ කෙත් බිම්, කමත් අරක්ගෙන ඇති මෙම බලවේග පරාජය කර අපගේ භූමියේ උරුමය ආරක්ෂා කර ගැනීම සඳහා රජයේ අදාල ආයතන වලට අවශ්‍ය ශක්තිය ධෛර්‍යය ලබාදීම සඳහා පෙරමුණු ගෙන කටයුතු කළ යුත්තේ අපගේ ගොවි ජනතාව බව ඉතා පැහැදිලිය. මෙම ප්‍රඥප්තිය නැවත වරක් තහවුරු කල යුතු බවද, ඒ අනුව ආසියානු පැසිෆික් කලාපයේ ආණ්ඩු මෙහෙයවිය යුතු යයිද, 1993 අගෝස්තු මස තායිලන්තයේ පවත්වන ලද සම්මන්ත්‍රණයකදී මෙම කලාපය නියෝජනය කළ සියළුදෙනාම ඒකමතිකව තීරණය කළහ.

ඩී. පී. පී. සෙනෙවිරත්න
අධ්‍යක්ෂ
ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

1993 වප් මස 14 වන දින

# පටුන

පෙරවදන

මූලධර්ම ප්‍රකාශනය ........ 4

කාර්ය වැඩසටහන ........ 8

සංවර්ධනය වන රටවල ජාතික කාර්ය වැඩ සටහන් ........ 8

I. අරමුණු හා උපාය මාර්ග ........ 8

II. ඉඩම්, ජලය හා වෙනත් ස්වාභාවික සම්පත් කරා ළඟාවීම ........ 11

III. ජනතා සහභාගීත්වය ........ 15

IV. ස්ත්‍රීන් ග්‍රාමීය සංවර්ධනයට අනුකලනය කිරීම ........ 17

V. යෙදවුම්, වෙළඳ පොලවල් හා සේවා ලබා ගැනීමේ ඉඩකඩ ........ 19

VI. කෘෂි නොවන ග්‍රාමීය කටයුතු සංවර්ධනය ........ 22

VII. අධ්‍යාපනය, පුහුණුව හා ව්‍යාප්තිය ........ 23

ගොවි කටයුතු ප්‍රතිසංස්කරණය හා ග්‍රාමීය සංවර්ධනය සඳහා අන්තර්ජාතික ප්‍රතිපත්ති ........ 25

VIII. අන්තර්ජාතික වෙළඳාම ........ 26

IX. සංවර්ධනය වන රටවල් අතර ආර්ථික හා ශිල්පීය සහයෝගය ........ 28

X. විදේශ ආයෝජන ........ 30

XI. සංවර්ධන ආධාර ........ 31

XII. ආහාර සහ කෘෂිකර්ම සංවිධානය හා එක්සත් ජාතීන්ගේ පද්ධතියේ වෙනත් සංවිධාන සඳහා කාර්ය වැඩ සටහන ........ 34

පුස්තකාලය
LIBRARY
ගො. ප. පු. ආ.
ARTI

# පෙරවදන

දිළිඳුකමට හා සාගින්නට විරුද්ධ දීර්ඝකාලීන හා දුෂ්කර අරගලයේ වැදගත් සිද්ධියක් 1979 ජූලි මාසයේ සිදුවිය. එය නම් ගොවි කටයුතු ප්‍රතිසංස්කරණය හා ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුව විසින් මූලධර්ම ප්‍රකාශනයක් හා වැඩ සටහනක් රෝමයේදී සම්මත කරනු ලැබීමයි. ඒ සමගම එම ලෝක සමුළුවේ නියෝජනය වූ ආණ්ඩු 145 මේ වැදගත් ලියවිල්ලේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී සාමාජික රටවලට ආධාර කිරීම සඳහා වරයක් එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයට දුන්නේ ය.

මේ ප්‍රතිපත්ති ප්‍රකාශය හා වැඩ සටහන ඇත්ත වශයෙන් ග්‍රාමීය දිළිඳු ජනයාගේ අයිතීන් පිළිබඳ ප්‍රඥප්තියකි. එය ග්‍රාමීය සංවර්ධනය ලෝක ගැටළුවක් බවත්, එය ගම් මට්ටමේදී ග්‍රාමීය ආයතනයන්ගේ ක්‍රියාකාරීත්වය මගින්ද, රාෂ්ට්‍රීය මට්ටමේ දී ජාතික සංවර්ධන ප්‍රතිපත්තිවල යොමුව වෙනස් කිරීමෙන් ද, ලොවපුරා නව අන්තර් ජාතික ආර්ථික පටිපාටියක් ඇති කිරීමෙන් ද විසඳිය යුතු බවත් පෙන්වා දෙයි.

ග්‍රාමීය දිළිඳුකම නැති කිරීම සඳහා අවශ්‍ය අති මහත් ප්‍රයත්නයට සංවර්ධිත හා සංවර්ධනය වන රටවල්ද එමෙන්ම සමස්තයක් වශයෙන් අන්තර්ජාතික ප්‍රජාවද ආධාර විය යුතුය.

ග්‍රාමීය දිළිඳු ජනයාට ඉඩම් හා ජල සම්පත්ද කෘෂිකාර්මික යෙදවුම් හා සේවාවන් ද ව්‍යාප්ති හා පර්යේෂණ පහසුකම්ද ලබා දිය යුතු ය. ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන් සැලසුම් කිරීමේදී ක්‍රියාත්මක කිරීමේදී හා විකාශනයේදී සහභාගී වීමට ඔවුන්ට ඉඩ දියයුතුය. දිළිඳුකම අඩුකිරීම දෙසට යොමු වූ ග්‍රාමීය සංවර්ධන උපාය මාර්ගයන් ක්‍රියාත්මක කිරීම පහසු කරවනු පිණිස අන්තර්ජාතික වෙළඳම හා විදේශ ආයෝජනය පිළිබඳ ව්‍යුහය හා රටාව සකස් කළ යුතුය.

වර්ධනය අවශ්‍යය එහෙත් එය ප්‍රමාණවත් නැත. සාධාරණය මගිනුත් ප්‍රධාන කොටම, ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන් හා ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ දී. ක්‍රියාත්මකකිරීමේදී හා ඒවා ඇගැයීමේදී ජනතා සහභාගීත්වය මගිනුත් එය ශක්තිමත් කළ යුතු ය.

අවසාන විග්‍රහයේදී ගොවි කටයුතු ප්‍රතිසංස්කරණ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ වගකීම ඇත්තේ ආණ්ඩු හා ඒවායේ ජනතාව වෙත ය. දේශපාලන බැඳීමක් හා ඔවුන්ගේ අධිෂ්ඨාන්විත ප්‍රයත්නයන් මත ය. එහෙත් ඊට සම්බන්ධ වීමට නම් ජනතාවට අරමුණක් දියයුතුය. අඩුම වාසි ලබන්නවුන්ට විශේෂ අවධානය දක්වමින්, ජනතාවට ප්‍රශ්න හඳුනා ගැනීමට හා ග්‍රාමීය සංවර්ධනය කෙරෙහි තම නොසැලෙන බැඳීම සහතික කිරීම අනුබල දීම අවශ්‍ය ය.

මේ ප්‍රකාශණය අදහස් කෙරී ඇත්තේ සමාජ හා දේශපාලන නායකයින්ට මෙන්ම උගතුන්ට, චින්තකයින්ට හා ලේඛකයින්ටත් ය. එය ලෝක සමුළුවේ පණිවුඩය ප්‍රචාරය කිරීමට සමත් සියලු දෙනාට ළං වීමට නියමිත ය. එය දිළිඳුකම ජය ගැනීම සඳහා වූ මිනිසාගේ අරගලයේ සන්ධිස්ථානයක් වනු ඇතැයි ආහාර හා කෘෂිකර්ම සංවිධානය බලාපොරොත්තු වෙයි.

එඩුවාර්ඩ් සවුමා

අධ්‍යක්ෂ ජනරාල්, එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය

# මූලධර්ම ප්‍රකාශය

කෘෂිකාර්මික ප්‍රතිසංස්කරණය හා ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුව 1979 ජූලි 12 වැනිද සිට 20 වැනිද දක්වා ඉතාලියේ රෝම නගරයේදී රැස් විය

මේ සමුළුව ගොවි කටයුතු පිළිබඳ හා ග්‍රාමීය ප්‍රශ්න සහිත අන්තර්ජාතික ප්‍රජාවගේ දීර්ඝ හා ගැඹුරු කාර්යයන් දිගටම ගෙනයෑමක් බව සිහිපත් කරමින්;

කලින් පැවැත්වුනු එක්සත් ජාතීන්ගේ සමුළු විශේෂයෙන් 1974 ලෝක ආහාර සමුළුව, එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ VI වැනි හා VII වැනි විශේෂ සැසිවාර හා රාජ්‍යයන්ගේ ආර්ථික අයිතීන් හා යුතුකම් පිළිබඳ ප්‍රඥප්තියද සිහිපත් කරමින්;

සංවර්ධන ප්‍රයත්නයන් වැඩිම හරිය තවමත්, විශේෂයෙන් සංවර්ධනය වන රටවල ග්‍රාමීය පෙදෙස්හි, ජනතාවන්ගේ ප්‍රාර්ථනයන් හා ඔවුන්ගේ මූලික අවශ්‍යතා මානව ගරුත්වයෙන් අන්තර්ජාතික සමාජ සාධාරණයේ හා සහයෝගීතාවේත් ප්‍රතිපත්තිවලට අනුකූලව ඉටු කිරීමට සමත් වී නැති බව පිළිගනිමින්,

පශ්චාත් - සංවර්ධන ප්‍රයත්නයන් හා වැඩසටහන් ගම්බද ප්‍රදේශවලට ළඟාවීමට හා ඒවාට ප්‍රතිලාභ ගෙනදීමට බොහෝදුරට අසමත් වී ඇති බවත් බොහෝ අවස්ථාවල එම සංවර්ධන ප්‍රයත්නයන් නාගරික-ග්‍රාමීය අසමතුලනයට තුඩු දී ඇති බවත්, ග්‍රාමීය ජනයාගේ සැබෑ සංස්කෘතික සාරධර්මන්හි ප්‍රවේගය හා විවිධත්වය නොතකා හැර ඇති බවත්, ග්‍රාමීය අංශය තුළ අසමතුලනයට හේතු වී ඇති බවත් දනිමින්,

සමාජ-ආර්ථික සංවර්ධන සංගර්භය තුල උචිත ජනගහන ප්‍රතිපත්ති උපයෝගී කර ගැනීමේ අවශ්‍යතාවය ද පරිසර විද්‍යාත්මක සංගතතාවය ඇති කර ගැනීමේ හා සීමිත. සම්පත් ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාවද වටහා ගනිමින්,

දිළිඳුකම සාගින්න හා මන්ද පෝෂණය ජාතික සංවර්ධන ප්‍රයත්නයන්ට බාධා කරන බවත්, ලෝක සමාජ හා ආර්ථික ස්ථාවරභාවයට අහිතකර ලෙස බලපාන බවත්, ඒවා මුලිනුපුටා දැමීම ලෝක සංවර්ධනයේ ප්‍රධාන අරමුණ බවත් විශ්වාස කරමින්,

ගොවිකටයුතු ප්‍රතිසංස්කරණය ග්‍රාමීය සංවර්ධනයේ ඉතාවැදගත් අංගයක් බවත් ජාතික ස්වශක්තිය වැඩි දියුණු කර ගැනීම හා නව අන්තර්ජාතික ආර්ථික පටිපාටිය ගොඩනැගීම පිළිබඳ රාමුව තුළ ග්‍රාමීය ප්‍රදේශයන්හි අඛණ්ඩ දියුණුව සඳහා ඉඩම්, ජලය හා වෙනත් සම්පත් කරා වඩා පූර්ණ ලෙස හා වඩා සාධාරණ ලෙස ළඟ වීමට හැකි වීමද ආර්ථික හා දේශපාලන බලය වඩා පුළුල් අන්දමින් භුක්ති විඳීම හා වඩා ඵලදායක සේවා නියුක්තියද, මිනිස් නිපුණතා හා ශක්තීන් වඩා පූර්ණ ලෙස පාවිච්චි කිරීමද , නිෂ්පාදන හා බෙද හැරීමේ පද්ධතියට ග්‍රාමීය ජනයාගේ සහභාගීත්වය හා අනුකලනයද, සියලු ජන කණ්ඩායම් සඳහා නිෂ්පාදනය, පලදාව හා ආහාරයේ සුරක්ෂිතතාව වැඩි කිරීම ද, අභ්‍යන්තර සම්පත් සංවිධානය කර ගැනීමද අවශ්‍ය බව ඒත්තු ගනිමින්, ලෝක සාමය හා නිරායුධකරණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ යෝජනාව සහ සියලුම

ආකාරයේ විදේශ ආධිපත්‍යයන්ද, වාර්ගික වෙනස්කම් කිරීම්ද, වර්ණ භේදයද, යටත් විජිතමය, නව යටත් විජිතමය හා විදේශීය ආධිපත්‍යයන්ද සූරාකෑමද අවසන් කිරීම සඳහා සියලු ස්වාභාවික සම්පත් කෙරෙහි ස්ථිර වශයෙන් ස්වෛරීභාවය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ප්‍රයත්නයන්ට අදාල VI වැනි සැසිවාරයේ 3201 වැනි හා 3202 වැනි යෝජනාවල වලංගු භාවය නැවත ස්ථිර කරමින් හා ගොවි කටයුතු ප්‍රතිසංස්කරණය හා ග්‍රාමීයසංවර්ධනය කෙරෙහි ඒවායේ බලපෑම පිළිගනිමින්,

ගොවි කටයුතු ප්‍රතිසංස්කරණය හා ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ මූලික වගකීම පැවරෙන්නේ ඒ ඒ ආණ්ඩුවලට වන අතර, දිගට පවතින්නා වූත්, ලෝක ව්‍යාප්ත වූත් වැඩසටහනක් සඳහා ප්‍රබල දේශපාලන කැපවීමක්, අන්තර්ජාතික ප්‍රජාවේ සක්‍රිය සහයෝගීතාවත් මූල්‍ය, ශිල්පීය හා මානව සම්පත් හොඳට ක්‍රමානුකූලව හා සම්බන්ධීකරණය කරන ලද ආකාරයකින් යෙදවීම හා ඵලදායක අන්දමින් ප්‍රයෝජනයට ගැනීමත් අවශ්‍ය බව වටහා ගනිමින්,

එම සහයෝගීතාවය, ස්වාධීනත්වයත්, ජාතික ස්වෛරීභාවයත්, ජනතාවන්ගේ ස්වයංතීරණයත්; රාජ්‍යයන්හි අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් නොවීමත් යන ප්‍රතිපත්ති තරයේ පිළිපැදීම මත පදනම් වියයුතු යයි ස්ථිර කරමින්; සංවර්ධනය වන රටවල ආර්ථික හා සමාජ සංවර්ධනය ඉදිරියට ගෙන යෑම සඳහාත්, සංවර්ධනය හා අන්තර්ජාතික ආර්ථික සහයෝගය පිළිබඳ ක්ෂේත්‍රයන්හි සියලු තීරණ ගැනීමට හා ක්‍රියාත්මක කිරීමට සංවර්ධනය වන රටවල් සාධාරණ ලෙස, පූර්ණ ලෙසත් හා ඵලදායක ලෙසත් සහභාගී වීම සහතික කරනු සඳහා නව අන්තර්ජාතික සංවර්ධන උපාය මාර්ගය මගින් සංවර්ධනයේ සියලු අංශයන් එකිනෙකට සම්බන්ධ කරන හා ඒකාග්‍ර කරන මිණුම් දඬු සමූහයක් සැපයිය යුතු යි යනුවෙන් එක්සත් ජාතීන්ගේ සභා මණ්ඩලය එහි 33 වැනි සැසි වාරයේ දී සම්මත කළ අදල යෝජනාව සිහිපත් කරමින්,

ගොවි කටයුතු ප්‍රතිසංස්කරණය හා ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ අන්තර්ජාතික සහයෝගය ශක්තිමත් කිරීම සඳහා වූ පියවරවල් වඩාත් ඵලදායක වන්නේ ජාතික උපාය මාර්ගයන් කර්මාන්ත හා කෘෂිකර්මය අතර අන්‍යෝන්‍ය රඳ පැවැත්ම මුළුමණින් පිළිගන්නා විට බව අවධාරණය කරමින්;

නව අන්තර්ජාතික සංවර්ධන උපාය මාර්ගයක් පිළියෙල කිරීම එක්සත් ජාතීන්ගේ පද්ධතිය සතු වගකීමක්ව බවත්, මේ නව උපාය මාර්ගයේ ආහාර, කෘෂිකර්මය, පෝෂණය හා තම ප්‍රවීනත්වය පවත්නා වෙනත් අංශයන් සම්බන්ධ කොටස් සවිස්තරව දැක්වීමේ පැහැදිලි යුතුකමක් ආහාර හා කෘෂිකර්ම සංවිධානයට එහි ව්‍යවස්ථාවේ කොන්දේසි යටතේ තිබෙන බවත් පිළිගනිමින්;

පහත දැක්වෙන මාර්ගෝපදේශයන් හා මූල ධර්මයන් පදනම් කරගෙන කාර්ය වැඩ පිළිවෙල පදනම් කර ගත යුතු යයි මෙයින් ප්‍රකාශ කර සිටී:

(i) සංවර්ධනයේ මූලික අරමුණ නම් පෞද්ගලික හා සමාජ දියුණුවත්, අභ්‍යන්තරික හැකියාවන්ගේ සංවර්ධනයත්, සියලු ජනතාවගේ, විශේෂයෙන් ග්‍රාමීය දිළිඳු ජනයාගේ, ජීවන තත්ත්වයන් ඉහළ නැංවීමත් බව:

(ii) තම ස්වාභාවික සම්පත් හා ආර්ථික කටයුතු කෙරෙහි පූර්ණ හා සදාකාලික ස්වෛරීභාවය පැවැත්වීමටත්, තම සම්පත් සැලසුම් කිරීම හා කළමනාකරණය සඳහා අවශ්‍ය පියවරවල් යොද ගැනීමටත් සෑම රාජ්‍යයක්ම සතු අයිතිය ග්‍රාමීය සංවර්ධනය සඳහා අතිශයින් වැදගත් බව;

(iii) සංවර්ධනය වන රටවල කෘෂිකාර්මික සංවර්ධනය සඳහා විදේශීය ආයෝජනයන්, විශේෂයෙන් අධිජාතික සමාගම්වල ආයෝජනයන්, පාවිච්චි කිරීම ජාතික අවශ්‍යතා හා ප්‍රමුඛතා අනුව කළ යුතු බව;

(iv) සාධාරණය හා සහභාගිත්වය සහිත වර්ධනය මත පදනම් වූ ජාතික ප්‍රගතිය සඳහා, ග්‍රාමීය ජනයා උදෙසා සේවා නියුක්තින් හා ආදයම් සඳහා වඩාත් පුළුල් ඉඩ ප්‍රස්තාත්, ගොවි සංගම්, සමුපකාරයන් හා ප්‍රාථමික ද්‍රව්‍ය නිෂ්පාදකයින්ගේ හා ග්‍රාමීය කම්කරුවන්ගේ වෙනත් ආකාරයේ ස්වේච්ඡා ස්වතන්ත්‍ර ප්‍රජාතන්ත්‍රවාදී සංවිධාන සංවර්ධනයන් සහිතව ආර්ථික හා දේශපාලන බලය නැවත බෙදීමක් ද, ග්‍රාමීය ප්‍රදේශ ජාතික සංවර්ධන ප්‍රයත්නයන්ට වඩාත් පූර්ණ ලෙස අනුකලනය කිරීමද අවශ්‍ය බව;

(v) උචිත ජනගහන ප්‍රතිපත්ති හා වැඩ සටහන් දීර්ඝ කාලීන සමාජ හා ආර්ථික ප්‍රගතියට ආධාර විය හැකි බව;

(vi) ග්‍රාමීය සංවර්ධනය සඳහා දේශීය සම්පත් සංවිධානය කිරීමට හා නිෂ්පාදනශීලී අන්දමින් පාවිච්චි කිරීමට උපරිම ප්‍රයත්නයන් යෙදිය යුතු බව;

(vii) ආණ්ඩු විසින් ග්‍රාමීය සංවර්ධනයට හිතකර අන්දමින් නියත පක්ෂපාතීත්වයක් ඇති කළ යුතු බව සහ ග්‍රාමීය ප්‍රදේශවල ආයෝජන හා නිෂ්පාදන වැඩි කිරීම සඳහා දිරිගැන්විය යුතු බව;

(viii) ග්‍රාමීය සංවර්ධනය සඳහාත්, මානව සම්පත් සංවිධානය කිරීම සඳහාත්, දිළිඳුකම තුරන් කිරීම තුළින් සහනය සැලසීම පිණිස නිෂ්පාදනය වැඩි කිරීම සඳහාත්, පරිසරයේ තුලනය හා පරිසර ආරක්ෂාව ගැන නිසි සැලකිල්ලක් දක්වමින් භූමිය, ජලය හා වෙනත් නිෂ්පාදන සම්පත් සාධාරණ ලෙස බෙදීම හා කාර්යක්ෂම ලෙස පාවිච්චිය අත්‍යවශ්‍ය බව;

(ix) පුළුල් පදනමකින් යුතුව ග්‍රාමීය සංවර්ධනය සඳහා ඒකාබද්ධ බෝග වගා සහ සත්ව පාලන සංවර්ධනය, ධීවර කර්මාන්තය හා ජලජ ජීවීන් ඇතිකිරීම හා ඒකාබද්ධ වන සංවර්ධනයද ඇතුළු ග්‍රාමීය ආර්ථික කටයුතුවල විවිධාංගීකරණය අවශ්‍ය බව;

(x) රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේද කර්මාන්තයන්, විශේෂයෙන් කෘෂිකාර්මික කර්මාන්තයන්, ග්‍රාමීය ප්‍රදේශවල පිහිටුවීම කෘෂිකර්මයත් කාර්මික සංවර්ධනයත් අතර අවශ්‍ය වූත් අන්‍යෝන්‍ය වශයෙන් ශක්තිමත් කරන්නා වූත් බැමි සපයන බව;

(xi) ගොවි කටයුතු පිළිබඳ හා ග්‍රාමීය පද්ධතින්ට බලපාන ප්‍රතිපත්ති හා වැඩ සටහන් පිළියෙල කළ යුත්තේ හා ක්‍රියාත්මක කළ යුත්තේ තරුණයින් ද ඇතුළු ග්‍රාමීය ජනයාගේත් ඔවුන්ගේ සියලු මට්ටම්වල සංවිධානයන්ගේත් පූර්ණ අවබෝධය හා සහභාගීත්වය ඇතිව බව සහ සංවර්ධන ප්‍රයත්නය ග්‍රාමීය දිළිඳු ජනයාගේ විවිධ කණ්ඩායම්වල විවිධ අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දැක්විය යුතු බව;

(xii) ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ගැටළු හා ඉඩ ප්‍රශ්නා පිළිබඳව සියලු මට්ටම්වල ජනයා අතර අවබෝධය හා දැනුමත්, කාර්යක්ෂම සංනිවේදන පද්ධතියක් මගින් සංවර්ධන සේවක පිරිස හා බහු ජනතාව අතර අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කිරීමත් ග්‍රාමීය සංවර්ධන උපාය මාර්ගයේ සාර්ථකත්වය සඳහා පූර්වාවශ්‍යතාවයන් බව;

(xiii) සම්පත් පුද්ගලයන් කීප දෙනෙක් වටා සංකේන්ද්‍රණය වීමේ පැරණි රටාවන් නැවත තහවුරු වීමෙන් හෝ සූරා කෑම පිළිබඳ අළුත් ස්වරූපයන් බිහිවීමෙන් හෝ ගොවි කටයුතු ප්‍රතිසංස්කරණයේ හා ග්‍රාමීය සංවර්ධනයේ ප්‍රතිලාභයන් අහෝසි වී නොයන බව සහතික කරනු සඳහා නිරන්තර සුපරීක්ෂාකාරීත්වයක් පැවැත්වියයුතු බව;

(xiv) ග්‍රාමීය සංවර්ධනයේ සමාජ ආර්ථික හා දේශපාලන ක්‍රියාවලීන්ට පුරුෂයින් හා සම සමව ස්ත්‍රීන් ද සහභාගී විය යුතු හා ආධාර විය යුතු බව, සහ ඔවුන්ද ග්‍රාමීය ප්‍රදේශවල ජීවිතයේ වැඩි දියුණු වූ තත්වයන් පූර්ණ ලෙස භුක්ති විඳිය යුතු බව;

(xv) ග්‍රාමීය සංවර්ධනය සඳහා මූල්‍ය හා ශිල්පීය සම්පත් ගලා ඒම වැඩි කරනු පිණිස අන්තර් ජාතික සහයෝගය ශක්තිමත් කළ යුතු අතර හදිසි අවශ්‍යතාවය පිළිබඳ අළුත් හැඟීමක් ඇති කළ යුතු බව;

(xvi) ලෝක ආහාර සුරක්ෂිතතාව සහතික කරනු සඳහාත්, සංවර්ධනය වන රටවලට වැදගත්කමින් යුතු කෘෂිකාර්මික ද්‍රව්‍ය පිළිබඳ වෙළඳමේ අසමානත්වයන් හා අස්ථාවරභාවයන් මැඩ පැවැත්වීම සඳහාත් සියලු ආණ්ඩු අළුත් හා වඩා සූක්ෂම ප්‍රයත්නයන් දැරිය යුතු බව; හා

(xvii) සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ජාත්‍යන්තර සංවර්ධන සංවිධානයන් වල උදව් ලබා ගනිමින් ග්‍රාමීය සංවර්ධනය සඳහා සහයෝගීතාවය වඩාත් ශක්තිමත් කළ යුතු බවත්, සාමූහික ස්වයං-විශ්වාසනීයත්වය සඳහා වන ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතු බව;

මේ මාර්ගෝපදේශයන් හා ප්‍රතිපත්ති අනුව හා ඒ ඒ රටේ පවත්නා තත්වයන්ට නිසි සැලකිල්ල දක්වමින් මේ සමුළුව පහත දැක්වෙන කාර්ය වැඩ සටහන සම්මත කරන අතර ඒ ඒ ආණ්ඩුද ආහාර හා කෘෂිකර්ම සංවිධානයද අන් සියලු අදාල සංවිධානද එය ක්‍රියාත්මක කිරීම මැනැවැයි නිර්දේශ කරයි.

# කාර්ය වැඩ සටහන

## සංවර්ධනය වන රටවල ජාතික කාර්ය වැඩ සටහන

### I අරමුණු හා උපාය මාර්ග

ගොවි කටයුතු ප්‍රතිසංස්කරණයේ හා ග්‍රාමීය සංවර්ධනයේ අරමුණ නම් ග්‍රාමීය ජීවිතය හා කටයතු ඒවායේ සියලු ආර්ථික, සමජ, සංස්කෘතික, ආයතනික, පරිසරාත්මක හා මානව අංශයන්ගෙන් පරිවර්තනය කිරීමයි. මේ පරිවර්තනය සාක්ෂාත් කර ගැනීම සඳහා වූ ජාතික අරමුණු හා උපාය මාර්ගයන් පෝෂණය වැඩි දියුණු කිරීම ද ඇතුළු වන සේ දිළිඳුකම මුලිනුපුටා දැමීමට යොමු වියයුතු අතර, ඒවා සාධාරණය සමග වර්ධනයත්, ආර්ථික හා දේශපාලන බලය නැවත බෙදීමත් ජනතා සහභාගිත්වයත් ඉටු කර ගැනීම සඳහා වූ ප්‍රතිපත්ති විසින් පාලනය විය යුතු ය. මේ උපාය මාර්ගයන්ට පෞද්ගලික ඉඩම්වල විශාලත්වයට උපරිම සීමා පැනවීමත්, ආයෝජනය, නිෂ්පාදනය හා සේවා නියුක්තිය වැඩි කිරීම සඳහා සම්පත් ඒකරාශි කිරීමත්, සුළු ගොවීන් සඳහා ආර්ථික පදනම ශකතිමත් කිරීමත් ගොවි සමාජ සමුපකාරයන් හා ග්‍රාමීය දිළින්දන්ගේ වෙනත් කණ්ඩායම් මෙන්ම රාජ්‍ය ගොවිපළවල් ද සංවිධානය කිරීමත්, ශිල්පීය නවීකරණයන් හඳුන්වාදීමත්, ප්‍රමාණවත් දිරිගැන්වීම් හා මිල ගණන් මගින් සම්පත් පාවිච්චියේ කාර්යක්ෂතාව ඇති කිරීමත්, ග්‍රාමීය හා නාගරික ප්‍රදේශයන්ගේ සමතුලිත සංවර්ධනයත්, නිෂ්පාදන සම්පත් හා ප්‍රගතියේ ප්‍රතිලාභ බෙදා ගැනීමේදී යුක්තිය හා සාධාරණත්වයත් ඇතුළත් විය යුතු ය.

එක් එක් ආණ්ඩුව තම තමන්ගේ ග්‍රාමීය සංවර්ධන උපාය මාර්ගයන් තම තමන්ගේ සමාජ-දේශපාලන අරමුණු, හැකියාවන් හා (මානව, භෞතික හා මූල්‍ය) සීමාවන් පිළිබඳ විශ්ලේෂණයක් මත පදනම්ව සමස්ත ආර්ථික හා සමාජ සැළසුම්කරණයට අදාලව පිළියෙල කළ යුතු ය. ප්‍රතිපත්තිද හඳුනා ගන්නා ලද ප්‍රමුඛත්ව අංශද ඒකාබද්ධව යොදා ගැනීමේ අවශ්‍යතාව සැළකිල්ලට ගත යුතු එබඳු උපාය මාර්ගයන්හිදී, ආණ්ඩු පහත දැක්වෙන ඉලක්කයන් ඇතිව ක්‍රියා කිරීම ගැන සලකා බැලියයුතු ය.

#### (අ) ඉලක්ක

(i) පරිසර සමතුලනයද සම්පත් ආරක්ෂා කිරීම හා අළුත් කිරීමද කෙරෙහි නිසි සැලකිල්ල දක්වමින් ග්‍රාමීය ප්‍රදේශවල ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා අරමුණු හා අපේක්ෂා පිළියෙල කර ගැනීම.

(ii) මේ අරමුණ හා අපේක්ෂා පිළිබඳ රාමුව ඇතුළත, ආදයමේ හා සේවා නියුක්තියේ සමස්ත වර්ධනය සඳහා වූ ජාතික ඉලක්කයන්ට සැසඳෙන ආකාරයෙන් ගොවි කටයුතු ප්‍රතිසංස්කරණය හා ග්‍රාමීය සංවර්ධනය සඳහා නිශ්චිත ඉලක්ක නියම කර ගැනිම

(iii) සමස්ත ජාතික සංවර්ධන සැළසුම් හා වැඩ සටහන් පිළිබඳ රාමුව ඇතුළත,

විශේෂයෙන් ආහාර නිෂ්පාදනය සම්බන්ධයෙන්, වැඩි ස්වශක්තියක් ඇති කර ගැනීම සඳහා ඉලක්කයන් ස්ථාපිත කිරීම.

(iv) ඉඩම් හා වෙනත් වත්කම් බෙදී යෑමද (ග්‍රාමීය-නාගරික වෙනස්කම් හා ග්‍රාමීය ආදායම් බෙදී යෑමද ඇතුළුව) ආදායම් මට්ටම්ද, මූලික අවශ්‍යතා, විශේෂයෙන් පෝෂණය පිළිබඳ අවශ්‍යතා ඉටු වීමට අදාළව ඒකාන්ත දිළිඳු බවේ ප්‍රමාණයද පිළිබඳ දර්ශකයන්ගෙන් මැනෙන පරිදි ග්‍රාමීය දිළිඳුකම අඩු කිරීම පිණිස 1980 ගණන් හා 1990 ගණන් සඳහා නිශ්චිත ඉලක්කයන් නියම කිරීම.

(v) සාධාරණ වැටුප් මත, විශේෂයෙන් ඉඩම් නැත්තවුන් සඳහා සේවා නියුක්ති ඉඩ ප්‍රස්තා පුළුල් කිරීමටත්, ගොවීන්, ධීවරයින්, ශිල්පීන් හා වෙනත් ස්වයං සේවා නියුක්ති කණ්ඩායම් සඳහා ඵලදාව හා ආදායම වැඩි කිරීමටත් ප්‍රමාණාත්මක ඉලක්කයන් සහිත ප්‍රතිපත්ති හා වැඩසටහන් පිළියෙල කිරීම.

(vi) හැකි තාක් කෙටි කාලයක් ඇතුළත, නිසැකයෙන්ම මේ සියවසේ අවසානයට පෙර, දැඩි මන්ද පෝෂණය පිළිබඳ තත්ත්වයන් නැති කර දැමීමට මූලික අවධානය යොමු කිරීම, පෝෂණ ඉලක්කයන් ඉටු කර ගැනීමේ අරමුණ ඇතිව කෘෂිකාර්මික හා ආහාර නිෂ්පාදන වැඩි කිරීම සඳහා සැලසුම්, ප්‍රතිපත්ති හා වැඩ සටහන් පිළියෙල කර ගැනීම.

(vi) අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සැපයුම් සඳහා ඉලක්කයන් නියම කර ගැනීමෙන් හා හිඟයක් සහිත කාලයන්හි දී සාධාරණ ලෙස හා අප්‍රමාදව බෙද හැරීම සහතික කිරීමෙන් දිළිඳු ජනයාට ආහාර පිළිබඳ වැඩි ආරක්ෂාවක් සැපයීම. මේ කාර්යය සඳහා ජාතික ආහාර සංචිතයක් ගොඩනැගිය යුතු අතර, ඒ ඒ රටේ තත්වයන්ට උචිත පරිදි ආහාර බෙද හැරීමේ ආයතන ඇති කළ යුතුය.

(viii) හැකි තාක් ඉක්මනින් හා නියත වශයෙන් මේ සියවස අවසානයට පෙර ඇති කර ගත යුතු අවම ආදායම් පිළිබඳ ඉලක්කයන් නියම කර ගැනීම.

(ix) ග්‍රාමීය ප්‍රදේශයන්ට ආරක්ෂා සහිත බොන වතුර, පවුල් සැලසුම් කිරීම, ප්‍රාථමික සෞඛ්‍ය රක්ෂණය, නිවාස (ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය ඇතුළු) අධ්‍යාපනය, මංමාවත්වලට ළඟ විය හැකිවීම, සංවේදන මාර්ග, විදුලි බලය වැනි මහජන උපයෝගීතා හා සේවාවන් සැපයීම සඳහා කාල සීමාවන් සහිත ඉලක්කයන් නියම කර ගැනීම.

(ආ) සම්පත් යෙදවීම

(i) සමස්ත සංවර්ධන වියදම් වැඩි කිරීමට, රජයේ අරමුදල් වලින් වඩා විශාල පංගුවක් වෙන් කිරීමට හා විශේෂයෙන් සෞඛ්‍යය හා අධ්‍යාපනය ඇතුළු ආර්ථික හා සමාජ පොදු සේවා ව්‍යුහයන්හි ආයෝජනයන් මගින් ග්‍රාමීය සංවර්ධනය සඳහා සම්පත් වැඩි කිරීම.

(ii) සමස්ත සම්පත් වලින් ග්‍රාමීය අංශයට වෙන් කරනු ලබන පංගුව ග්‍රාමීය වර්ධනයේ හා දිළිඳුකම අඩු කිරීමේ අවශ්‍යතාවයන්ට ප්‍රමාණවත් බවත් ග්‍රාමීය ජනගහණයේ විශාලත්වයට උචිත බවත් සහතික කිරීම.

(iii) රජයේ වියදම්ද බදු හා මිල ප්‍රතිපත්තිද පහත දැක්වෙන පරමාර්ථ ඇතිව සමාලෝචනය කිරීම, උචිත පරිදි සකස් කිරීම හා ශක්තිමත් කිරීම :

(අ) ඉඩම් හා වෙනත් නිෂ්පාදන සම්පත් පිළිබඳ ඌන-උපයෝගිතාවය ඇතුළුව, ග්‍රාමීය සංවර්ධනය සඳහා රාජ්‍ය හා පෞද්ගලික සම්පත් සංවිධානය කොට යොදා ගැනීම හා පාවිච්චියේ කාර්යක්ෂමතාව වැඩි කිරීම.

(ආ) පරිසර ආරක්ෂාවට පටහැණි නොවන ප්‍රමාණයට තාක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා ඇති බාධක ඉවත් කිරීම හා අවශ්‍ය තැන්වල අනුබලයන් සැපයීම, ග්‍රාමීය ඉතිරි කිරීම් සංවිධානයට යොදා ගැනීම, භූමියෙහි නැවත ආයෝජනය හා ගොවිපල වලට සම්බන්ධ හා අසම්බන්ධ ආයෝජන හා ව්‍යවසායිකත්වයන් දියුණු කිරීම.

(iv) ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රාදේශීය මානව හා ද්‍රව්‍යමය සම්පත් ඒකරාශි කොට යොදා ගැනීම සඳහා වූ ස්වයං-ආධාර කටයුතු සංවිධානය කිරීමට රාජ්‍ය ආයතනයන් විසින් ක්‍රියාශීලීව අනුබල දෙනු ලැබීම සඳහා විධිවිධාන සැලසීම

(ඇ.) ග්‍රාමීය ආයතන හා ජනතා සහභාගිත්වය

(i) ජාතික ප්‍රතිපත්තියේ රාමුව ඇතුළත තීරණ ගැනීමේ ක්‍රියාවලිය විමධ්‍යගත කිරීම හා ප්‍රාදේශීය පාලන ආයතන දියුණු කිරීම

(ii) ග්‍රාමීය සංවර්ධන කටයුතු පිළිබඳ තීරණ ගැනීම සඳහා මෙන්ම ඒවා ක්‍රියාත්මක කිරීම හා ඇගැයීම සඳහාද වගකීම වැඩි කරමින් ප්‍රාදේශීය පාලන ආයතනයන්ට බලය පැවරීම.

(iii) ගොවි කටයුතු ප්‍රතිසංස්කරණය හා ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන් පිළිබඳ තීරණ ගැනීමට, ඒවා ක්‍රියාත්මක කිරීමට හා ඇගැයීමට ග්‍රාමීය දිළිඳු ජනයාගේ සහභාගීත්වය ශක්තිමත් කරනු පිණිස ග්‍රාමීය කම්කරු සමාජයන් හා සමුපකාරයන්ද ඇතුළු ජනතා සංවිධාන දියුණු කිරීම.

(ඈ.) සමීක්ෂණ හා ඇගැයීම

(i) ග්‍රාමීය ආදායම, පරිභෝජනය හා පෝෂණය පිළිබඳ මට්ටම් හා බෙදී යෑම; සෞඛ්‍ය ආරක්ෂාව, අධ්‍යාපනය හා වෙනත් පොදු සේවාවන් ලබාගත හැකි

වීම හා ළඟ විය හැකිවීම; කෘෂිකාර්මික ශ්‍රමය සඳහා සැබෑ වැටුප් මට්ටම්; පොලී අනුපාතිකයන් හා ගෙවල් කුලී; ඉඩම් හා වෙනත් නිෂ්පාදන වත්කම් බෙදී යෑම; හා නිවාස ද ඇතුළුව ග්‍රාමීය ජීවන තත්ත්වයන්ට අදල වෙනත් තොරතුරු යන කරුණු පිළිබඳ ප්‍රමාණාත්මක දත්තයන් නිත්‍ය පදනමක් මත එකතු කරන්නට පටන් ගන්න. මේ විෂයාංකයන්ට අදල මූලික තොරතුරු 1980 වර්ෂයට පිහිටුවා, ඉන් පසු ආහාර හා කෘෂිකර්ම සංවිධානයට එකක් හැර එකක් වශයෙන් ද්වි වාර්ෂිකයන්ට අදලව වෙනස් වීම් වාර්තා කරන්න.

(ii) අරමුනු හා ඉලක්කයන් දෙසට ප්‍රගතිය සහතික කරනු සඳහා වෙනස් කිරීම් අවශ්‍යදැයි තීරණය කරනු පිණිස, ග්‍රාමීය ආර්ථිකය තුළට හෝ ඉන් පිටතට සම්පත් ගලා යෑම කෙරෙහි ප්‍රතිපත්තිවල හා වෙනත් සාධකයන්ගේ සමස්ත බලපෑම කලින් කල නැවත තක්සේරු කරන්න.

## II ඉඩම්, ජලය, හා වෙනත් ස්වාභාවික සම්පත් කරා ළඟාවීම

ඉඩම් අයිතිය හා පාවිච්චිය ද ජලය හා වෙනත් හාවික නිෂ්පාදන සම්පත් කරා ළඟා වීම ද පිළිබඳ ක්‍රම තීරණය වන්නේ ඒ ඒ රටවල ඓතිහාසික, දේශපාලන, සමාජ හා ආර්ථික තත්ත්වයන් විසිනි. ඒවා විවිධ රටවල් අතර වෙනස් වේ. ඒවා ග්‍රාමීය ආර්ථිකයන්ගේත්, ආදයම් බෙදී යෑමේත්, ග්‍රාමීය ජීවිතයේ පොදු තත්වයන්ගේත් නිර්ණායකයෝය.

මේ ක්‍රම ග්‍රාමීය සංවර්ධනයටත්, ග්‍රාමීය බහුජනතාවගේ අති විශාල බහුතරය සඳහා සමාජ සාධාරණය හා ඉඩම් හා වෙනත් ස්වභාවික සම්පත් කරා පුළුල් ලෙස ළඟා වීමටත් බාධාවන් හැටියට නිශ්චය කෙරෙන තැන්වල, ආණ්ඩු ඒවායේ ජාතික හා ග්‍රාමීය සංවර්ධන අරමුණු පිළිබඳ රාමුව ඇතුළත් ආයතන, නෛතික හා ප්‍රතිපත්තිමය වෙනස් කිරීම ගැන සලකා බැලිය යුතු ය. එබඳු පියවරවල් හා ක්‍රියා පටිපාටි පිළිබඳ අවශ්‍යතාව ගැන අදල ජනයාගේ පුළුල් අවබෝධයක් ඇති කළ යුතු ය.

### අ. ඉඩම් භුක්තිය ප්‍රතිසංවිධානය කිරීම

ග්‍රාමීය සංවර්ධන උපාය මාර්ගයේ කොටසක් වශයෙන් හා බලය නැවත බෙදීමේ මඟක් වශයෙන් ඉඩම් භුක්තියේත් ඉඩම් නැති ගොවීන්ට ඉඩම් නැවත බෙද දීමත් අවශ්‍යවන රටවල් ආණ්ඩු පහත සඳහන් කරුණු සඳහා පියවරවල් ගැන සලකා බැලිය යුතුය:

(i) පෞද්ගලික ඉඩම්වල විශාලත්වය පිළිබඳ උපරිම සීමාවන් පැනවීම හා ජාතික වශයෙන් තීරණය කරනු ලබන ප්‍රතිපත්ති වලටත් රාජ්‍යයන්ගේ ආර්ථික අයිතීන් හා යුතුකම් පිළිබඳ ප්‍රඥප්තියටත් අනුකූලව ඉඩම්, ජලය, වෙනත් ස්වාභාවික සම්පත් හා ගොවිපල වත්කම් අත්පත් කර ගත යුතුය.

(ii) ජලජ ජීවීන් සඳහා යෝග්‍ය ජල ප්‍රදේශ හා මුඩු බිම් අත්පත් කරගෙන නැවත සුදුසු තත්ත්වයට පත් කොට ඒවා ජලජ ජීවීන් ඇති කිරීම සඳහා ගොවීන්ට හා ධීවරයින්ට බෙද දිය යුතු ය.

(iii) අත්පත් කර ගන්නා ලද දේපල බෙදදීමේදී ඉතාම දිළිඳු කණ්ඩායම් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වමින්, ස්ථාපිත කුලී කරුවන්ට, සුළු ඉඩම් හිමියන්ට හා ඉඩම් නැති කෘෂිකාර්මික කම්කරුවන්ට මුල් තැනදීම හා, සමුපකාරයන් ද ගොවීන්ගේ වෙනත් ආකාරයේ සමාජයන් ද රජයේ අංග සම්පූර්ණ ආධාර ඇතිව පිහිටුවීම ද ඇතුළුව, ඵලදාව වැඩි දියුණු කිරීම සඳහා වූ වැඩ සටහන් මගින් එවැනි නැවත බෙදීම් ශක්තිමත් කිරීම.

(iv) ආයෝජන ඉවත් කර ගැනීම ද එම වත්කම් අත්පත්කර ගනු ලැබීමෙන් බේරා ගැනීම සඳහා විකිණීම ද වළක්වනු පිණිස ස්මරක නීතිමය දණ්ඩනයන් ද යොදා ගනිමින්, නැවත බෙද දීම් වේගවත්ව හා අධිෂ්ඨානාත්මකව කිරීම.

(v) සම්පත් සංකේන්ද්‍රණය වීමේ අළුත් රටා හෝ සූරාකෑමේ වෙනත් ස්වරූපයන් හෝ බිහි වීම වළක්වනු සඳහා, ප්‍රතිලාභ ලබන්නන්ගේ හැකිතාක් පුළුල් සහභාගිත්වය ඇතිව, ගොවි සමාජයන්, සමුපකාරයන්, සාමූහික හා රාජ්‍ය ගොවිපලවල් ඇතුළු පශ්චාත්-ප්‍රතිසංස්කරණ ආයතන හා සංවර්ධන කටයුතු ඇති කිරීම හා ඒවාට ආධාර දීම.

### ආ. භුක්ති ප්‍රතිසංස්කරණය හා ග්‍රාමීය වැටුප් පාලනය

ඉඩම් හා වෙනත් වත්කම් සැලකිය යුතු අන්දමින් නැවත බෙදීම රටේ උපාය මාර්ගයේ කොටසක් වුවත් නැතත්, පහත සඳහන් කටයුතු කිරීමට පියවර ගැනීම ගැන ආණ්ඩුව සලකා බැලිය යුතු ය.

(i) අඳ ගොවීන්ද ඇතුළු කුලී කරුවන් පිළිබඳ වාර්තා පිළියෙල කිරීම හා පැවැත්වීම

(ii) අඳ ගොවීන් ද ඇතුළු කුලී කරුවන්ට සාධාරණ වන කුලී උපරිමයන් සහතික කරනු පිණිස නීතිමය පියවරවල් ඇති කිරීම හා ඵලදායක ලෙස ක්‍රියාත්මක කිරීම.

(iii) සමජ සාධාරණය ඇති කිරීමේත් ණය හා සේවාවන් ලබා ගැනීමේ ඉඩකඩ වැඩි කිරීමේත් ආයෝජනය පිබිදවීමේත් මගක් වශයෙන්, අඳ ගොවීන්ද ඇතුළු කුලීකරුවන්ගේ භුක්තියේ සුරක්ෂිතතාව සහතික කිරීම.

(iv) කණ්ඩායම් සහයෝගිතාව ඇති කිරීමත්, පාලන පියවරවල් ක්‍රියාත්මක වීම අධීක්ෂණය කිරීමත්, නීතිමය පිළියම් සෙවීම කුලීකරුවන්ගේ හැකියාව වැඩි කිරීමත් සඳහා කුලීකරුවන්ගේ සංවිධාන පිහිටුවීමට අනුබල දීම.

(v) ග්‍රාමීය කම්කරුවන් සූරා කෑමෙන් ආරක්ෂා කිරීම සඳහා අවම වැටුප් තත්වයන් ද ඇතුළුව වැඩ කොන්දේසිවලට අදාල ග්‍රාමීය ශ්‍රමික නීති පැනවීම හා ක්‍රියාත්මක කිරීම.

**ඇ. සම්ප්‍රදායික භුක්තියෙහි වෙනස්වීම් පාලනය කිරීම**

රටේ සංවර්ධන උපාය මාර්ගයේ කොටසක් වශයෙන් සම්ප්‍රදායික භුක්ති ක්‍රමවල වෙනස්වීම් අවශ්‍යවන අවස්ථාවන්හිදී ආණ්ඩුව පහත සඳහන් කාර්යයන් සඳහා පියවර ගැනීම ගැන සලකා බැලිය යුතුය :

(i) අයිතීන් පිළිබඳ අයට පෞද්ගලීකරණය හා ළඟ නැති අයිතිකරුවන් කරා වූ ප්‍රවණතා නැවැත්වීම.

(ii) සංවර්ධන අවශ්‍යතාවන්ට අනුකූලව ඉඩම් හා ජල අයිතිවාසිකම් පුළුල් පදනමක් සහිතව ප්‍රජාව විසින් පාලනය කරනු ලැබීමේ ක්‍රම ආරක්ෂා කිරීම හා සකස් කිරීම හෝ නිර්මාණය කිරීම.

(iii) සත්ව පාලන ජනයාට ප්‍රතිලාභ ලැබෙන බවට සහතික කරමින් සත්ත්ව සම්පත් වඩාත් කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා වැඩ සටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම

**ඈ. ඉඩම් තහවුරු කිරීම, කණ්ඩායම් ගොවිතැන, සමූපකාර හා සාමූහික හා රජයේ ගොවිපලවල් ඇති කිරීම.**

ඉඩම් තදබල ලෙස කැබලි වීම නිසා වී නිෂ්පාදන කාර්යක්ෂමතාවට බාධා පැමිණෙන රටවල ආණ්ඩු පහත දැක්වෙන කාර්යයන් සඳහා පියවර ගැනීම ගැන සලකා බැලිය යුතුය:

(i) පලදාව හා කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා කැබලි වූ හා විසිරුණු ඉඩම් තහවුරු කිරීම (ඒකාබද්ධ කිරීම) සඳහා වූ ප්‍රයත්නයන් උත්සන්න කිරීම හා ඒ සමගම, තහවුරු කිරීම නිසා කුලීකරුවන්ගේ ඕනෑ එපාකම් කෙරෙහි අහිතකර බලපෑමක් සිදු නොවන බව සහතික කිරීම.

(ii) විශේෂයන්ම තහවුරු කිරීමේ පියවරවල් නිසා, මුද හරිනු ලබන ශ්‍රමිකයන් සඳහා සේවා නියුක්තිය තහවුරු කරනු පිණිස, කැබලි වුණු ඉඩම් සඳහා වූ තහවුරු කිරීමේ පියවරවල් ප්‍රජා ව්‍යාප්ත හා ප්‍රදේශ ව්‍යාප්ත සංවර්ධන වැඩ සටහන් සමග සම්බන්ධ කිරීම.

(iii) පොදු සේවා ව්‍යුහය පුළුල් වීමෙන්, පර්යේෂණ වලින් යෙදවුම් හා ශිල්පීය නිපුණතා වඩා හොඳින් ප්‍රයෝජනයට ගනු ලැබීමේත්, ප්‍රතිලාභයන් සහභාගී වන්නන්ට ලැබීම සහතික කරන ආකාරයන්ගෙන් සංවිධාන වූ කණ්ඩායම් ගොවිතැනට, රජය සතු ගොවිපලවලට, මහජනයා සතු ගොවිපල වලට, සමූපකාරයන්ට හා කණ්ඩාම් භුක්තිය පිළිබඳ වෙනස් ස්වරූපයන්ට අනුබල දීම.

### ඉ. ස්වාභාවික සම්පත් පිළිබඳ ප්‍රජා පාලනය

කැලෑ, ඉඩම් හා ජලය හා වෙනත් ස්වාභාවික සම්පත් සම්බන්ධයෙන්, ආණ්ඩු පහත සඳහන් කාර්යයන් සඳහා පියවර ගැනිම ගැන සලකා බැලිය යුතු ය :

(i) පොදු යහපත සඳහාත්, කාන්තාර බවට පත්වීම හා සෝදාපාලුව ද ඇතුළුව පරිසර සංරක්ෂණයට ගැලපෙන පරිදි හා ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ අවශ්‍යතාවන්ට නිසි සැලකිල්ල දක්වමින්, එබඳු සම්පත් පිළිබඳ පාලනය හා කළමනාකරණය සඳහා කටයුතු සැලැස්වීම.

(ii) රාජ්‍ය හා පෞද්ගලික ක්ෂේත්‍රයෙහි ස්වාභාවික සම්පත්වලට ළඟා වීමට සාධාරණ ඉඩකඩ සහතික කිරීම හා එබඳු සම්පත් වඩා හොඳින් පාවිච්චි වීමට සැලැස්වීම.

(iii) පස සෝදා පාලුව හා එය පාලනය කිරීමේ ක්‍රම ගැන තොරතුරු හා දැනුම හැකිතාක් පුළුල් ලෙස පැතිරවීම.

(iv) ප්‍රාදේශීය ප්‍රජාවන් සම්බන්ධව කෙරෙන වැඩපිළිවෙලවල් මගින් ධීවර හා වන සම්පත් සංරක්ෂණය කිරීම හා කළමනාකරණය කිරීම.

### ඊ. හිස් පොදු ඉඩම්වල ජනයා පදිංචි කරවීම

සැලකිය යුතු ප්‍රත්‍යන්ත බිම් ඇති රටවල, ආණ්ඩු පහත දැක්වෙන කාර්යයන් සඳහා පියවර ගැනීම ගැන සලකා බැලිය යුතු ය.

(i) පරිසරය පිළිබඳ යහපත් ප්‍රතිඵලයන්ට අනුකූල වන පරිදි, ඉඩම් නැති පවුල් හැකිතාක් විශාල සංඛ්‍යාවක් සඳහා අළුත් බිම්වල ජනාවාස ඇති කිරීම හා ඒවායේ සාර්ථකත්වය සහතික කරනු පිණිස අවශ්‍ය පොදු සේවා ව්‍යුහය හා ආර්ථික හා සමාජ සේවාවන් ඒවාට සැපයීම

(ii) ආර්ථික වශයෙන් ඔරොත්තු දිය හැකි බව එම වැඩ පිළිවෙල් වලට තිබෙන බවත් ඒවා දැනටමත් ජනයා පදිංචි කරනු ලැබ ඇති ප්‍රදේශවල අවශ්‍ය ගොවි කටයුතු ප්‍රතිසංස්කරණයන්ට ආදේශයක් නොව ඊට අතිරේක බවත් සහතික කිරීම

### උ. අන්තර් ප්‍රාදේශීය හා අන්තර් ප්‍රජා අසමානතකම් අඩු කිරීම

අන්තර් ප්‍රාදේශීය හා අන්තර් ප්‍රජා අසමානතකම් තිබෙන රටවල ආණ්ඩු පහත සඳහන් කාර්යයන් සඳහා පියවර ගැනීම ගැන සලකා බැලිය යුතු ය.

(i) විවිධ ග්‍රාමීය ප්‍රදේශ හා ප්‍රජාවන් අතර සම්පත් හා ආදායම් ප්‍රාදේශීය වශයෙන් හා ජාතික වශයෙන් ඒකාබද්ධ නිෂ්පාදන හා බෙදහැරීමේ පද්ධතීන් ඇති කිරීම.

(ii) ලැබී තිබෙන සම්පත්වල හා තිබෙන සමාජ හා ආර්ථික පොදු සේවා ව්‍යුහයේ අසමානකම්වලට වන්දි ලැබෙන ආකාරයට සමස්ත ආයෝජන වැඩසටහන් පිළියෙළ කිරීම හා මුදල් වෙන් කිරීමේ අන්තර් - ප්‍රාදේශීය හා අන්තර් - ප්‍රජා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

**III ජනතා සහභාගීත්වය**

තම ජීවිත පාලනය කරන ආයතනයන්ට හා පද්ධතීන්ට ජනතාවගේ සහභාගිත්වය මූලික මානව අයිතියක් වන අතර, එය වාසි සහිත කණ්ඩායම්වලට හිතකර අන්දමින් දේශපාලන බලය යළි පෙළගැස්වීම සඳහාත් සමාජ හා ආර්ථික සංවර්ධනය සඳහාත් අවශ්‍ය ය. ග්‍රාමීය සංවර්ධන උපාය මාර්ගයන්ට, ඒවායේ සම්පූර්ණ ශක්‍යතාව සාක්ෂාත් කර ගත හැක්කේ, ප්‍රතිපත්ති හා වැඩ සටහන් සංකල්පගත කිරීමේ දී හා සැළසුම් කිරීමේදීත්, ඒවා ක්‍රියාත්මක කිරීම හා ඇගැයීම සඳහා සමුපකාර හා වෙනත් ස්වේච්ඡා සංවිධාන ස්වරූපයන්ද ඇතුළුව පරිපාලන, සමාජ හා ආර්ථික ආයතන ඇති කිරීමේදීත් අඩු වාසි සහිත ජන කොටස් කෙරෙහි විශේෂ අවධාරණයෙන් යුතුව ග්‍රාමීය ජනතාව පහළම මට්ටමේදී උනන්දු වීම, ක්‍රියාශීලීව සම්බන්ධ වීම හා සංවිධානය වීම, මගින් පමණි.

ජනතාවගේ ඵලදයක සහභාගීත්වය සඳහා පදනම සපයනු පිණිස ආණ්ඩු පහත සඳහන් කාර්යයන් සඳහා පියවර ගැනීම ගැන සලකා බැලිය යුතු ය :

අ. ජනතා සංවිධානය

(i) ග්‍රාමීය ජනතාවට තමන් කැමති සංවිධානයන් තුළ නිදහසේ සම්බන්ධකම් පැවැත්වීමට ඇති සියලු බාධා ඉවත් කිරීම හා අන්තර්ජාතික කම්කරු සංවිධානයේ අංක 87 හා 141 දරණ සම්මුති ද, ආර්ථික හා සමාජ සංවර්ධනයේ දී ග්‍රාමීය කම්කරු සංවිධානයන් සතු කාර්යභාරය පිළිබඳ 149 වැනි නිර්දේශය ද සම්මත කිරීම, හා ක්‍රියාත්මක කිරීම

(ii) ගොවි හා කම්කරු ගම්වලින් ග්‍රාමීය සමුපකාරයන්ගේත්, ස්වශක්තිය මත යැපෙන ස්ථානීය, ප්‍රාදේශීය හා ජාතික සම්මේලන ආණ්ඩුවේ නියත ආධාරය ඇතිව හා ඒවායේ ස්වතන්ත්‍රතාවට නිසි සැලකිල්ල දක්වමින් පිහිටුවීමට අනුබල දීම

(iii) ග්‍රාමීය ජනතාවට ග්‍රාමීය සංවර්ධන ආයතනයන්හි කටයුතුවලට සහභාගී වීමට සැලැස්වීම හා මේ ආයතන ඒවායේ වැඩසටහන් වලින් ප්‍රතිලාභ ලබනු ඇතැයි අපේක්ෂිත ජනයාගේ සංවිධාන සමග සමීප සහයෝගයෙන් ක්‍රියා කරන බව සහතික කිරීම.

(iv) විවිධ ආර්ථික, සමාජ හා සංස්කෘතික සේවාවන් සපයන ජනතා සංවිධානයන්ට ප්‍රජා මට්ටමේ දී ස්වශක්තිය සංවර්ධනය කර ගැනීමට අනුබල දීම හා නීතිමය හා මූල්‍ය අවශ්‍යතා ඉටු කිරීම, නායකයින් පුහුණු කිරීම හා වෙනත් මූලික වුවමනාවන් ඉටු කර ගැනීමට ආධාර වීම වැනි

ආකාරයන්ගෙන් ඒවාට ආධාර දීම හා ඒවායේ ස්වධීනත්වයට හානියක් නොකිරීමට ප්‍රවේශම් වීම.

(v) ග්‍රාමීය කර්මාන්ත වැඩසටහන් ද, ඇතුළුව සංවර්ධන ව්‍යාපෘති හඳුනා ගැනීමේදී, ක්‍රියාත්මක කිරීමේ දී හා ඇගැයීමේදී ස්ථායීය මට්ටමින් ඒවාට සහභාගී වීමට ග්‍රාමීය ජනතා සංවිධානයනට ඉඩ ප්‍රස්ථා සැපයීම

(vi) නාගරික හා ග්‍රාමීය තරුණ ජනයාගේ, අවශ්‍යතාවන්ට, හැකියාවන්ට හා සිතුම් පැතුම්වලට ප්‍රතිචාර දක්වන, ජාතික ස්වේච්ඡා සේවා, ග්‍රාමීය තරුණ සංගම් හා වැඩ අධ්‍යයන වැඩසටහන් ද ඇතුළු වැඩසටහන් හා සම්මන්ත්‍රණ මගින් විවිධ ග්‍රාමීය සංවර්ධන කටයුතු සඳහා නාගරික හා ග්‍රාමීය යන දෙඅංශයේම තරුණ ජනයාගේ ශක්තීන් ක්‍රියාවට නැංවීම.

**ආ. ප්‍රාදේශීය පාලනය ශක්තිමත් කිරීම**

(i) තමන්ගේ ප්‍රදේශවලට අදල සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමේ දී පිළියෙල කිරීමේ හා ක්‍රියාත්මක කිරීදේ, ජනතා සහභාගීත්වයට ඉඩ සැලසෙන පරිදි, ජාතික ප්‍රතිපත්තියේ රාමුව ඇතුළත, ආණ්ඩුවේ තීරණ ගන්නා ආයතන, විශේෂයෙන් සැලසුම් කිරීමෙ යන්ත්‍රණ විමධ්‍යගත කිරීම, ග්‍රාමීය දිළිඳු ජනයාගේ ඕනෑ එපාකම්වලට සහයෝගය දීම සහතික කරන බඳවා ගැනීමේ හා කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම.

(ii) තමන්ගේ සංවිධාන මගින් ග්‍රාමීය කම්කරුවන් සහභාගී වීම ද ඇතුළුව, ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රික හා ඵලදයක සහභාගිත්වයට ඉඩ සැලසීම සඳහා ස්ථායීය උසාවි ද ඇතුළු ස්ථායීය පාලන ආයතන ප්‍රතිසංස්කරණය කිරීම හා අවශ්‍ය තැන්වල දී නිර්මාණය කිරීම හා පුහුණු කිරීමේ හා උනන්දුව සැපයීමේ වැඩසටහන් මගින් එබඳු ආයතන පිළිබඳ සංවිධානයට හා කළමනාකරණයට ආධාර වීම.

(iii) අවාසි සහිත කණ්ඩායම් වලට, සංවර්ධන තීරණයන්ට සහභාගී වීමේ හැකියාව වැඩිකර ගැනීමටත්, යෙදවුම්වලින්, තාක්‍ෂණයෙන් හා රජයේ සේවාවන්ගේන් වඩා ඵලදයක ලෙස ප්‍රයෝජන ගැනීමටත් ඔවුනට හැකි වනු පිණිස අධ්‍යාපනික හා පුහුණු වැඩසටහන් පිහිටුවීමට හා ශක්තිමත් කිරීමට ප්‍රාදේශීය පාලක ආයතනයන්ට උපකාර වනු පිණිස ඒවාට විශේෂ ආධාර සැපයීම.

**ඇ. ගොවි කටයුතු ප්‍රතිසංස්කරණයට සහභාගිවීම**

(i) ඉඩම් හා භුක්ති ප්‍රතිසංස්කරණයන්ගෙන් ප්‍රතිලාභ ලබනු ඇතැයි අපේක්‍ෂිත ජනයාගේ සංවිධාන පිහිටුවීමට අනුබල දීම, ඉඩම් හා ජල අයිතීන් නැවත බෙදීමේදීත්, කුලී නීති ක්‍රියාත්මක කිරීමේදී හා පාලනය කිරීමේදීත් ඒවා සම්බන්ධ කර ගැනීම.

(ii) රාජ්‍ය ආයතනයන්ගෙන් සැපයෙන ණය හා ද්‍රව්‍යමය යෙදවුම්, සුළු ඉඩම් හිමියන්ගේ, ඉඩම් හා භුක්ති ප්‍රතිසංස්කරණයන්ගෙන් ප්‍රතිලාභ ලබන්නන්ගේ හා වෙනත් ගොවි කණ්ඩායම්වල සංවිධාන ඔස්සේ සැපයීම.

(iii) ප්‍රතිලාභ ලබන්නන්ගේ හෝ ජනවාස ක්‍රමවල පදිංචි කරනු ලැබූවන්ගේ සංවිධානයන්ට ශ්‍රමය ඒකරාශී කොට යෙදවීමේ ඉඩ ප්‍රස්තා හා පොදු සේවා ව්‍යුහයේ ආයෝජනය සඳහා වෙනත් සම්පත් තිබෙන බව සහතික කිරීම.

## *IV ස්ත්‍රීන් ග්‍රාමීය සංවර්ධනයට අනුකලනය කිරීම*

එක්සත් ජාතීන්ගේ ස්ත්‍රී දශකයේ අරමුණු වලට අනුකූලව, කෘෂිකාර්මික වූත් කෘෂිකාර්මික නොවූත් කටයුතුවල ස්ත්‍රීන් ඉටු කරන කාර්යභාරය පිළිගැනීම සාර්ථකව ග්‍රාමීය සංවර්ධනය සැලසුම් කිරීමත්, වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමත් සඳහා පූර්වාවශ්‍යතාවකි. සංවර්ධනය සමග වර්ධනය මත පදනම් වූ ග්‍රාමීය සංවර්ධනය සඳහා ස්ත්‍රීන් පූර්ණ ලෙස අනුකලනය වීම අවශ්‍ය වන අතර, ඉඩම්, ජලය, වෙනත් ස්වාභාවික සම්පත්, යෙදවුම් හා සේවාවන් ලබා ගැනීමේ සාධාරණ ඉඩකඩ ද තම නිපුණතා සංවර්ධනය කර ගැනීමේ හා යෙදවීමේ සමාන ඉඩ ප්‍රස්තා ද ඊට ඇතුළත් ය. ග්‍රාමීය කටයුතුවල දී ස්ත්‍රීන් ඉටුකරන කාර්යභාරය පිළිබඳ වැඩි අවබෝධයක් ඇති කරනු සඳහා මේ තොරතුරු පතළ කිරීමේ හදිසි අවශ්‍යතාවක් තිබේ.

ආණ්ඩු පහත දැක්වෙන කාර්යයන් සඳහා පියවර ගැනීම ගැන සලකා බැලිය යුතු ය.

**අ. නීත්‍යානුකූල තත්වයේ ස්වාභාවය**

(i) දේපළ පිළිබඳ උරුමය, හිමිකම හා පාලනය සම්බන්ධ අයිතීන්ට අදාලව ස්ත්‍රීන්ට වෙනස්කම් කරන නීති අවලංගු කිරීම හා එබඳු පියවර වල අවශ්‍යතාව පිළිබඳ අවබෝධය ඇති කරවීම.

(ii) ළඟ නැති සැමියන් සහිත ස්ත්‍රීන් නිෂ්පාදකයින්ට තුමන් විසින් කළමනාකරණය කරනු ලබන ඉඩම් ගැන තීරණ ගැනීම සඳහා ඵලදයක නීතිමය අයිතීන් දීම සඳහා ස්ත්‍රීන්ට සමස්ත ඉඩම් පිළිබඳ ඒකාබද්ධ හිමිකම හා හවුල් හිමිකම ඇතුළු හිමිකම් ඇති කිරීම.

(iii) ස්ත්‍රීන්ට ඉඩම්. ගව ආදී සතුන් හා වෙනත් නිෂ්පාදන වත්කම් සමානව ලබාගැනීමේ ඉඩකඩ සහතික කිරීම සඳහා පියවරවල් යොදා ගැනීම.

(iv) ස්ත්‍රීන් ආර්ථික ගනුදෙනු වලටත්, ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමටත්, ක්‍රියාත්මක කිරීමට හා ඇගැයීමටත් ඵලදයක ලෙස සහභාගී වීම වලක්වන නීති හා රෙගුලාසි අවලංගු කිරීම.

(v) කුලීකරුවන්ගේ සමජ, කම්කරු සමිති, සමුපකාරයන්, ණය සමිති හා ඉඩම්

ප්‍රතිසංස්කරණයේත් වෙනත් ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන්වලත් ප්‍රතිලාභ ලැබූවන්ගේ සංවිධාන වැනි ජනතා සංවිධානයන් තුළ ස්ත්‍රීන් සඳහා පූර්ණ සාමාජිකත්වය හා ඡන්දය දීමේ පූර්ණ අයිතීන් සහතික කිරීම.

ආ. ග්‍රාමීය සේවාවන් ලබා ගැනීමට ස්ත්‍රීන්ට ඇති ඉඩකඩ

(i) සේවාවන් ලබාදීමේ දැන් පවත්නා පද්ධතීන්ට වෙනස්කම් කරනු ලැබීමකින් තොරව ළඟාවීමේ ඉඩකඩ මගින් ස්ත්‍රීන්ට කෘෂිකාර්මික යෙදවුම් හා සමාජ හා ආර්ථික සේවාවන් සැපයීම.

(ii) සාම්ප්‍රදායිකව ස්ත්‍රීන් ඇතුළත් කර නොගන්නා ලද විදවද් වෘත්තීය ක්ෂේත්‍ර ද ඇතුළුව, සියලු මට්ටම්වල සංවර්ධන ආයතනයන්ගේ පුහුණු හා ව්‍යාප්ති වැඩසටහන් තුළ ස්ත්‍රී සංඛ්‍යාව වැඩි කරනු සඳහා විශේෂ බඳවා ගැනීමේ හා පුහුණු කිරීමේ පටිපාටි ඇති කිරීම.

(iii) කෘෂිකාර්මික නිෂ්පාදනය, සකස් කිරීම, ආරක්ෂා කිරීම, හා අලෙවි කිරීම පිළිබඳව කටයුතුවලදී ස්ත්‍රීන්ගේ කාර්ය භාරයන්ට ආධාර පිණිස කෘෂිකාර්මික පුහුණු හා ව්‍යාප්ති වැඩ සටහන්වල පරාසය පුළුල් කිරීම.

ඇ. ස්ත්‍රීන්ගේ සංවිධානය හා සහභාගීත්වය

(i) පොදු සේවාවන් පිළිබඳ සම්පූර්ණ පරාසයටම, ග්‍රාමීය ස්ත්‍රීන්ගේ සහභාගීත්වය පහසු කිරීමත්, පුරුෂයින් සමග සමාන මට්ටමකින් ආර්ථික, දේශපාලන හා සමාජ කටයුතුවලට සහභාගීවීමට ග්‍රාමීය ස්ත්‍රීන්ගේ ඉඩප්‍රස්තා වැඩි කිරීමත් සඳහා ඔවුන්ගේ සාමූහික ක්‍රියා හා සංවිධානය වැඩි කිරීම.

(iii) විශේෂයෙන්ම කෘෂිකාර්මික සේවාවන්ට ද අධ්‍යාපන සේවාවන්ට ද පාසැල්වලට බඳවාගැනීමට ද, සෞඛ්‍ය හා වෙනත් සමාජ සේවාවන්ට ද, සේවා නියුක්තියට හා වැටුප්වලට ද අදාලව ස්ත්‍රීන්ගේ සහභාගීත්වයට ඇති බාධා හඳුනා ගැනීම හා හා ඇගැයීම සඳහා ස්ත්‍රී සංවිධානයන්ගේ ද සම්බන්ධය ඇතිව පද්ධතිය ස්ථාපිත කිරීම.

(iii) නිෂ්පාදන කටයුතුවලට ස්ත්‍රීන්ගේ සහභාගීත්වය හඳුනා ගැනීම, පිළිගැනීම හා ඇගැයීම පිණිස සංඛ්‍යාලේඛණාත්මක තොරතුරු එක්රැස් කිරීම, ඉදිරිපත් කිරීම හා වූ පටිපාටි ප්‍රතිශෝධනය කිරීම.

(iv) ආර්ථික,අධ්‍යාපනය හා දේශපාලන කටයුතුවලට ස්ත්‍රීන්ගේ වැඩි සහභාගිත්වයකට ඉඩ ලැබෙන පරිදි, ස්ත්‍රීන්ගේ ගෙදරදොර වැඩ පහසු කිරීම හා ඒවායේ බර අඩුකරනු පිණිස පර්යේෂණ හා තොරතුරු හුවමාරු ඇති කරවීම හා දවාලට ළමයින් බලා ගන්නා මධ්‍යස්ථාන වැනි වැඩ සටහනක් ස්ථාපිත කිරීම හා ශක්තිමත් කිරීම. එමෙන්ම ගෙදර දොර කටයුතුවලට හවුල් වීමට පුරුෂයින්ගේ වගකීම පිලිබඳ අවබෝධය දියුණු කිරීම.

### ඈ අධ්‍යාපනික හා සේවා නියුක්ති ඉඩප්‍රස්තා

(i) ස්ත්‍රී පුරුෂ දෙකොටසටම එක සමාන ගුණයෙන් හා අන්තර්ගයෙන් යුතු අධ්‍යාපනික ඉඩ ප්‍රස්තා වැඩිපුර ගැහැණු ළමයි හා ස්ත්‍රීන් බඳවා ගනු සඳහා අඩු ගාස්තු වැනි විශේෂ අනුබලයන් සැපයීම.

(ii) ස්ත්‍රීන් සඳහා ආදයම් ඉපදවීමේ ඉඩප්‍රස්තා වැඩි කිරීම හා එක්ම වටිනාකමක් ඇති වැඩ සඳහා පුරුෂයින්ට හා ස්ත්‍රීන්ට එක සමාන වැටුප් ප්‍රමාණයන් සහතික කිරීම.

(iii) ග්‍රාමීය ස්ත්‍රීන් සඳහා නායකත්ව පුහුණුව ද, කෘෂිකාර්මික මෙන්ම කෘෂි නොවන කටයුතු, සෞඛ්‍ය සංරක්ෂණය, දරුවන් ඇතිදැඩි කිරීම, පවුල් සැළසුම් කිරීම හා පෝෂණය පිළිබඳ උපදෙස් සැපයීම ද ඇතුළුව අවිධිමත් අධ්‍යාපනික ඉඩප්‍රස්තා ඇති කිරීම හා ශක්තිමත් කිරීම

(iv) සම්ප්‍රදයික ආර්ථික රටා වෙනස්විමත් නව තාක්ෂණය හඳුන්වා දෙනු ලැබීමත් නිසා ස්ත්‍රීන්ගේ සේවා නියුක්තියට හා ආදයමට ඇති විය හැකි අහිතකර බලපෑම් ඇගැයිම හා ඒවා අවම කිරීමට පියවර ගැනීම.

## *V යෙදවුම්,වෙළඳපොළවල් හා සේවා ලබා ගැනීමේ ඉඩකඩ*

වැඩිදියුණු කරන ලද බීජ, පොහොර, පළිබෝධනාශක හා වෙනත් තාක්ෂණික යෙදවුම් පාවිච්චිය සියලු සංවර්ධනය වන ප්‍රදේශවල අඩු අතර එය බොහෝවිට සුළු කොටසකට සීමා වේ. වඩාත් නිෂ්පාදනශීලී යෙදවුම් පාවිච්චියත්, ශ්‍රමය වඩා හොඳින් පාවිච්චියත්, තාක්ෂණයත් විකාශණය කිරීම හා ඉදිරියට ගෙන යෑම සඳහා ද සුළු ඉඩම් හිමියන්ට හා ගොවි සමුපකාරයන්ට යෙදවුම් හා සේවා බෙද හැරීම වැඩි දියුණු කිරීම සඳහා ද, ග්‍රාමීය ප්‍රදේශ තුළ ස්ථාවර වෙළඳ පාලවල් හා සාධාරණ මිල ගණන්, තීරණාත්මක පොදු සේවා ව්‍යුහය, ප්‍රමාණවත් මහජන උපයෝගීතාවන් හා වැඩි දියුණු කළ සමාජ හා ආර්ථික සේවාවන් සහතික කිරීම සඳහා ද ප්‍රතිපත්ති හා උපාය මාර්ගයන් අවශ්‍ය ය.

වැඩි ඵලදව හා සාධාරණය පිළිබඳ මේ අරමුණු ඉටුකර ගැනීම පිණිස පහත සඳහන් කාර්යයන් සඳහා පියවර ගැනීම ගැන ආණ්ඩුව සලකා බැලිය යුතු ය.

### අ. යෙදවුම් හා සේවා

(i) විශේෂයෙන් සුළු ගොවින් හා ඔවුන්ගේ කණ්ඩායම් විසින්, මිලයට ගන්නා ලද කෘෂිකාර්මික යොදවුම් වැඩිපුර හා වඩා කාර්යක්ෂම ලෙස පාවිච්චි කරනු ලැබීමට සලස්වනු පිණිස මිලගණන් පිළිබඳ ප්‍රතිපත්තීන්, පොලී අනුපාතිකයන් හා වෙනත් අදල ප්‍රතිපත්තීන් යොදා ගැනීම හා සකස් කිරීම.

(ii) යෙදවුම් හා සේවා ගබා ගැනීමේ සාධාරණ ඉඩකඩ හා සාධාරණ මිල ගණන් සහතික කරනු පිණිස, සංවිධානය වූ සුළු ගොවි කණ්ඩායම් හා

ග්‍රාමීය දිළින්දන්ගේ වෙනත් කණ්ඩායම් සෘජු ලෙස හා වඩ වඩාත් සම්බන්ධ වීමත් සහිතව, යෙදවුම් හා සමාජ හා ආර්ථික සේවාවන් ලබා දිම සඳහා ස්ථායීය හා ප්‍රාදේශීය ආයතන පිහිටුවීම හා ශක්තිමත් කිරීම.

(iii) ණය ද්‍රව්‍යමය යෙදවුම්, ව්‍යාප්තිය, කෘෂි ශිල්පීය පුහුණුව, අලෙවි කිරීම් තැන් ඇතුළු සම්පූර්ණ සේවා පරාසය නිසි කල්හි සැපයීම හා භාණ්ඩ හා සේවා ලබාදීමේ පද්ධතිය ස්ථානීය මට්ටමේදී ඵලදයක අන්දමින් අනුකලනය කිරීම.

(iv) යම් යම් රටවලට හෝ රටවල් තුළ ඒ ඒ ප්‍රදේශයන්ට හෝ වඩාත්ම හොඳින් ගැලපෙන පද්ධතින් විකාශණය කිරීම සඳහා ව්‍යාප්ත සේවාවන් ලබාදීමේ විකල්ප ක්‍රම ගැන අත්හද බැලීම් කිරීම, ව්‍යාප්ති සේවාවන් පොදුවේ සුළු ගොවීන්ගේ හා සමුපකාරයන්ගේ අවශ්‍යතා දෙසට යොමු කිරීම හා එබඳු වැඩසටහන්වල දී ශ්‍රව්‍ය - දෘශ්‍ය ආධාරකයන් ද ඇතුළු සංනිවේදන මාධ්‍යයන් පාවිච්චි කිරීම.

(v) යැපුම් ගොවීන්ට හා වෙනත් සුළු ගොවීන්ට සුදුසු තැන්වල දී වරණීය මිල ගණන්වලට, සංශෝධිත වෙළඳ ආයතන මගින් හා වෙළඳපොලවල් නොවන යන්ත්‍රණයන් මගින් යෙදවුම් ගලා ඒම වැඩි කරනු සඳහා වැඩසටහන් හා ආයතන සැලසුම් කිරීම.

(vi) අදල සමාජ සේවා හා විශේෂයෙන් සෞඛ්‍යයට හා පෝෂණයට අදල සමාජ සේවා ලබාගැනීමට ග්‍රාමීය ජනයාට ඇති ඉඩකඩ වැඩිදියුණු කිරීම හා දුබල කණ්ඩායම් වලට එම සේවා ලබාදිම සඳහා විශේෂ වැඩසටහන් සැලසුම් කිරීම.

**(ආ). ණය සහ වෙළඳ පොළවල්**

(i) යෙදවුම් හා සේවාවන් ලබාගැනීමේ ඉඩකඩ වඩාත් පුළුල් කිරීමත් පරිමාණය පිළිබඳ අරපිරිමැසුම් ඇති කර ගැනීමත් සේවා හා භාන්ඩ ලබාදීමේ පද්ධතීන්ට යන වියදම් අවම කිරීමත් සඳහා වෙළඳ නගර, පොදු පහසුකම් හා ග්‍රාමීය සේවා මධ්‍යස්ථාන පිහිටුවීම හා ශක්තිමත් කිරීම.

(ii) ස්ථානීය අවිධිමත් වෙළඳ පලවල්, ගොවි සමුපකාරයන් සහ අර්ධ ස්වතන්ත්‍ර ආයතන ප්‍රයෝජනයට ගනිමින් විශේෂයෙන් සුලු ගොවීන්ගේ නිෂ්පාදිතයන් අලෙවි ගබඩා කිරීම සහ ප්‍රවාහනය කිරීම, වැඩි දියුණු කිරීම.

(iii) පොදු සහ පෞද්ගලික ණය දෙන ආයතනයන් මගින් කෘෂි නිෂ්පාදකයන්ට ලබා ගතහැකි ණය ප්‍රමාණ්‍ය වැඩි කරන්නා වූ ද ඒවායේ ව්‍යවහාරයන්, නිවාස පරිභෝජනයන් සහ නිෂ්පාදන ණය සඳහාත් සම්ප්‍රදයික ණය දෙන්නන් ගේ ණය බේරීම සඳහාත් සුලු ගොවීන්ගේ අවශ්‍යතා වලට යොමු කරන්නාවූ ද ආයතනික ණය සැලසුම් කිරීම.

(iv) වැඩි වියදම් හා ණය තුරුස් වෙනුවෙන වන්දි දීම සඳහාත් සුලු ගොවීන්හට යෙදවුම් හා වෙනත් සේවාවන් සැපයීමේ වැඩි වියදම් සඳහාත් සහනාධාර අරමුදල් පිහිටුවීම.

(v) සුලු ගොවීන්ට හා අඩු ආදයම් සහිත නිෂ්පාදකයන් හට දෙන ණය පැහැර හැරීම වෙනුවෙන් සහ වියදම් ණය අභ්‍යන්තරික වන්දි ගෙවීමට අනතුරු අරමුදල් පිහිටුවීම.

(vi) පාදකයන්ට සාධාරණ ප්‍රතිඵල සහතික කිරීමෙන් කෘෂි නිෂ්පාදිකයන්ගේ වාරිකව හා වසරින් වසර අධික ලෙස සිදුවන මිල උස් පහත් වීම අඩු කිරීම සඳහා පියවර ගැනීම

(vii) වගා පාලුවීම් හා නිෂ්පාදනයන්ගේ මිල උස්, පහත් වලින් සුලු ගොවීන්ට එල්ල වන අනතුරු අවම කිරීම සඳහා රක්‍ෂණ, වන්දි මුදල් සැපයීම සහ මිල ආධාරකයන් සපයනු පිණිස ක්‍රම හැකි තැන්වල ස්ථාපිත කිරීම.

(viii) පොදු අරමුදල් වෙන් කිරීම්, වැඩි කිරීම මගින් මෙන්ම ස්වකීය සම්පත් සංවිධානය කොට යොද ගැනීමෙන් ද යෙදවුම් ලබා දීම හා නිපැයුම් අලෙවි කිරීම සඳහා අවශ්‍ය ග්‍රාමීය පොදු සේවා ව්‍යුහය (ප්‍රමාණවත් හා විදුලිබල පහසුකම්, වෙළඳපල වල් ග්‍රාමීය සේවා මධ්‍යස්ථාන ආදිය) පුලුල් කිරීම සහ වැඩිදියුණු කිරීම.

(ix) රටේ බාහිර වෙළඳ ඉඩ ප්‍රස්ථාවන්ට අදලව, දේශීය හා අපනයන භෝගයන් අතර සම්පත් උචිත ලෙස වෙන් කරනු ලැබීම සහතික කරන්නා වූත්, දේශීය ආහාර සහ පෝෂණ අවශ්‍යතාවන් ඉටු කිරීමට ඉඩ සලසන්නා වැනි මිල ප්‍රතිපත්තියක් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම

(ඇ). **පර්යේෂණ**

(i) ජාතික ආර්ථිකය තුළ ග්‍රාමීය අංශයේ වැදගත් කම හා සැසඳෙන මට්ටමකට ග්‍රාමීය ප්‍රදේශවල ගැටලු ගැන පර්යේෂණ සඳහා වූ අරමුදල් පංගුව වැඩි කිරීම හා, සමස්ථ පර්යේෂණ අරමුදල් වලින් ග්‍රාමීය අංශයේ පර්යේෂණ පිළිබඳව වැඩි පංගුව සම්බන්ධයෙන් නිශ්චිත ඉලක්කයන් ඇති කර ගැනීම

(ii) ග්‍රාමීය සංවර්ධනයට හා දිළිඳුකම අඩු කිරීමට අදලව පර්යේෂණ, ව්‍යාප්තිය සහ පුහුණුව පිළිබඳ පවත්නා ප්‍රමුඛතාවන් සමාලෝචනය කිරීම සහ ඒවා කුඩා නිෂ්පාදකයන් හා සමුපකාරයන් විසින් පාවිච්චි කරනු ලැබීමට සුදුසු ස්ථානෝචිත තාක්‍ෂණය යොද ගැනීම හා වැඩිදියුණු කිරීම දෙසට යොමු කිරීම.

(iii) අහස් ජලයෙන් කෙරෙන ගැනුම් ගොවිතැනත් යල ගොවිතැනත් එමෙන්ම අස්වැන්න හා පසු අස්වනු පාඩු හා ගබඩා කිරීම් පිළිබඳ විශේෂ ගැටලු සම්බන්ධ පර්යේෂණ උත්සන්න කිරීම.

(iv) අන්තර් විෂයයීය පදනමක් මත, තාක්ෂණික වෙනස් වීමේ සමාජ ආර්ථික ප්‍රතිඵල පිළිබඳ අදාල සමාජවිද්‍යා පර්යේෂණ සමග ආර්ථික හා තාක්ෂණික පර්යේෂණ සමග සම්බන්ධීකරණය කිරීම හා අනුකලනය කිරීම

(v) ස්වාභාවික සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ දී පරිසර හානි සහ අසමතුලනයන් අවම කිරීම, පර්යේෂණ සහ තාක්ෂණ, නවීකරණයන්ට අනුබල දීම

(vi) ගොවිපල ගොඩනැගිලි පදිංචිය නිවාස හා වෙනත් වැඩිදියුණු කිරීම් සඳහා ග්‍රාමීය දිළිඳු ජනයාගේ අවශ්‍යතාවන්ට උචිත අඩු වියදම් ගොඩනැගිලි තාක්ෂණය පිළිබඳ පර්යේෂණයන්ට ආධාර කිරීම

***VI* කෘෂි නොවන ග්‍රාමීය කටයුතු සංවර්ධනය**

වැඩි කෘෂිකාර්මික නිෂ්පාදනයත්, ආදායම වඩා සාධාරණ ලෙස බෙදී යාමත්, කාර්මික භාණ්ඩ හා සේවාවන් සඳහා බහුජන වෙළඳපලක් ද ඵලදයක ඉල්ලුමක් ද සපයයි.

ඔරොත්තු දෙන සුලු ග්‍රාමීය සංවර්ධනයක් සඳහා කාර්මිකකරණය අවශ්‍ය වේ. බොහෝ කර්මාන්ත ග්‍රාමීය ප්‍රදේශවල පිහිටුවිය හැකිය. දිළිඳු ජනයාගේ යහපතට හේතු වන පරිදි තාක්ෂණික සහ පරිමාණයට තිසි සැළකිල්ල දක්වමින් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා කෘෂි නොවූ ආර්ථික කටයුතුවල සීඝ්‍ර වර්ධනයක් ද, ග්‍රාමීය කර්මාන්තය මගින්, සේවා නියුක්තිය සඳහා ඉඩ ප්‍රස්තා ද, විදුලි බල සැපයුම. ප්‍රවාහනය හා සන්නිවේදනය, නිවාස, ජලසැපයුම අලෙවි හා ගබඩා පහසුකම් සඳහා වූ පුලුල් පොදු සේවා ව්‍යුහයක් ද අවශ්‍ය ය.

ගමින් නගරයට ජනයා ඇදී යාම මෙම පියවර නිසා අඩුවන අතර නාගරික මුඩුක්කු වර්ධනයද අඩුවී ඇත.

ග්‍රාමීය ප්‍රදේශවල කෘෂිකාර්මික නොවන කටයුතු සංවර්ධනය කිරීම සඳහා වූ උපාය මාර්ගයන් හිදී පහත සඳහන් කාර්යයන් සඳහා පියවර ගැනීම ගැන ආණ්ඩුව සලකා බැලිය යුතු ය.

**(අ) ග්‍රාමීය කාර්මිකරණය**

(i) විශේෂයෙන්ම කුඩා සහ මධ්‍යම පරිමාන කර්මාන්ත සඳහා මූල්‍ය අනුබල ක්‍රම සකස් කිරීම හා ග්‍රාමීය ප්‍රදේශයන් හි කර්මාන්ත කටයුතු පුලුල් ලෙස බෙද හැරීම සඳහා මහජන උපයෝගීතාවන් ගේ පිහිටීම සැලසුම් කිරීම.

(ii) මහජන උපයෝගීතා සහ පොදු සේවා ව්‍යුහයේ වෙනත් අංශ, නිරන්තරයෙන් සෞඛ්‍ය සේවා හා අධ්‍යාපනය ජලය. විදුලි බලය, මංමාවත්.ප්‍රවාහනය සහ සංනිවේදනය යන ඒවායින් වඩා විශාල කොටසක් ග්‍රාමීය පෙදෙස් වලට වෙන් කිරීම.

(iii) සමුපකාරයන් හා වෙනත් සුදුසු ආයතන හා සංවිධාන මගින් ගෘහ කර්මාන්ත ඇතුළු කාර්මික ව්‍යවසායකත්වය ග්‍රාමීය ජනයා අතර දියුණු කිරීම.

(iv) යෙදවුම්, ණය, වෘත්තීය අධ්‍යාපනය, පුහුණුව. සහ අලෙවි සේවා සපයනු සඳහා සේවා මධ්‍යස්ථාන පහසුකම් හා ආයතන ප්‍රාදේශීය මට්ටම්වල පිහිටුවීම සහ ශක්තිමත් කිරීම

(ආ) ග්‍රාමීය කර්මාන්ත වැඩ සටහන් සහ වෙනත් කෘෂි ගොවි කටයුතු

(i) විශේෂයෙන්ම වැඩ අඩු කෘෂිකාර්මික කාලයන් හීදී ප්‍රාදේශීය පාලන ආයතනයන් හා ජනතා සහභාගීත්වය මගින් ග්‍රාමීය සංවර්ධන සමග හොඳින් අනුකලනය වනු ග්‍රාමීය කර්මාන්ත වැඩ සටහන් සංවිධානය කිරීම

(ii) ඉඩම් නැති කම්කරුවන් ගේ සහ සුලු ගොවීන්ගේ යහපතට හේතු වන ප්‍රජා ග්‍රාමීය කර්මාන්ත වැඩ සටහනක් සඳහා, ස්ථානීය ආහාර නිෂ්පාදනය අඩු නොකිරීමට ප්‍රවේශම් වෙමින්, වෙනත් දෑ අතර,ආහාර ආධාර පාවිච්චි කිරීම.

(iii) යෙදවුම් ස්ථානීය වශයෙන් නිෂ්පාදනය කිරීම හා කෘෂිකාර්මික අංශයේ අමුද්‍රව්‍ය ස්ථානීය වශයෙන් සකස් කිරීම දියුණු කිරීමෙන් කෘෂි කර්මාන්තය සංවර්ධනය කිරීම හා එමගින් ග්‍රාමීය ජනයාට හිතකර කෘෂි කර්මාන්ත වැඩි ශක්තිමත් කිරීම.

(iv) ස්ථානීය ජනයා සම්බන්ධ කරමින්, වනසංරක්ෂණ කටයුතු දියුණු කිරීම හා පරිසර ආරක්ෂාව සඳහාත් ඉන්ධන, දැව නිෂ්පාදිතයන් හා ආහාර ද්‍රව්‍ය පිළිබඳ ස්ථානීය අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහාත් ග්‍රාමීය වන සංරක්ෂණයට ආධාර දීම

(v) සුලු නිෂ්පාදකයන්ගේ අවශ්‍යතා අවධාරණය කරමින් අලුත් සම්පත් වලින් ප්‍රයෝජන ගැනීමද, මාලු නිෂ්පාදිතයන් සංවර්ධනය ද, නාස්තිය අඩු කිරීම ද, පරිසර දූෂණය වැළැක්වීම ද ඇතුළුව ධීවර කර්මාන්තය සහ ජලජ ජීවී වගාව සංවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම

## *VII අධ්‍යාපනය පුහුණුව සහ ව්‍යාප්තිය*

පෙර පාසැල් සහ ප්‍රාථමික අධ්‍යාපනය ද පුහුණු හා ව්‍යාප්ත සේවා ද ග්‍රාමීය ප්‍රදේශවල මානව සංවර්ධනය සඳහාත් එමෙන්ම ග්‍රාමීය ආර්ථිකයන්ගේ ප්‍රසාරණය සහ නවීකරණය සඳහාත් මූලික අවශ්‍යතාවන් වේ.

ග්‍රාමීය ප්‍රදේශවල දරුවන් ද ඇතුළ සියළු දරුවන් සඳහා අක්ෂර සහ සංඛ්‍යා පිළිබඳ මූලික දැනුමක් නිදහස් අධ්‍යාපනත් ඉහළම ප්‍රමුඛතාවක් දරනු වවී. වැදගත් කමින් ඊට නො අඩු කරුණක් නම් නිපුනතා සංවර්ධනය හා වැඩි දියුණු කරගැනීම පිණිස එලදව

හා ආදායම් ජනන හැකියාවන් වැඩිකර ගැනීම පිණිස ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය සඳහාම පුහුණු හා ව්‍යාප්ත ජාලයන් නිර්මාණය කිරීම ප්‍රසාරණය කිරීමයි. ව්‍යාප්ත හා ගැටලු විසඳුම් පර්යේෂණ අතර ඵලදායක බැමි ඇතිකිරීමේ අවශ්‍යතාව ද ඇත. මේ අවශ්‍යතාවන් ගේ හදිසිකමත් සංවර්ධනය වන රටවල සම්පත් වලට අදාලව එම කර්තව්‍යයේ විශාලකමත් නිසා අධ්‍යාපනයත් මිල අඩු ක්‍රම හා කෙටි කාලීන පුහුණුව ගැන පරීක්ෂාවෙන් සලකා බැලීම මනාය

**ප්‍රතිපත්ති හා සැලසුම් පිළියෙල කිරීමේ දී ආණ්ඩු පහත සඳහන් කාර්යයන් සඳහා පියවරයන් සලකා බැලිය යුතු ය.**

(අ) අධ්‍යාපන හා පුහුණු ප්‍රතිපත්ති ප්‍රමුඛතා

(i) සංවර්ධනයේ අන් අංශයන්ට කාර්යක්ෂම වශයෙන් අදල වන පරිදි සැම දෙනාටම සාක්ෂරතාව ලබා දීමට හා එය පැවැත්වීමට උසස් ප්‍රමුඛතාවක් දීම හා වර්ෂ 2000 වනවිට එය කරා ළඟා වීම හෝ ඊට සමීප මට්ටමකට පැමිණීම මේ අරමුණු ඉටු කරගැනීම පහසුවනු පිණිස, නිරන්තරයෙන්ම පාසැල් වියේ දරුවනට අධ්‍යාපන වැඩ සටහන් වලට පරපූරක් වශයෙන් සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් ඇති කිරීම.

(ii) සාක්ෂරතාව පිළිබඳ අවධාරණය තබා ගනිමින් හා අධ්‍යාපනයෙන් සැපයෙනු ඇති ඉඩ ප්‍රස්ථා පිළිබඳ සමානත්වයට හානියක් නොවන පරිදි ශ්‍රමය සඳහා වූ ඉල්ලුමේ වාරික භාවයත් ග්‍රාමීය ප්‍රදේශවල කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රියාවලීන්ගේ ලක්ෂණ ඇතුළු, දෛනික ජීවිතයට සහ වැඩට ප්‍රාථමික හා ද්විතීයික පාඨමාලා වල විෂයමාලා හා නිර්දේශයන් සම්බන්ධ කිරීම, මේ සඳහා, එමෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල විශේෂ තත්ත්වයන්ට අනුකූලව විෂය මාලා සහ නිර්දේශයන් ප්‍රතිසංවිධානය කිරීම සඳහාත් ගොවිබිම් හා වෙනත් සම්පත් වෙන් කළ යුතුය.

(iii) සිටින ගොවීන්ගේ නිපුනතා සහ ව්‍යවහාරයන් ඉහළ නැංවීමට මූලික අවධානය යොමු කරමින්, කාර්ය සාක්ෂරතාව , සෞඛ්‍යය, ගෘහ ආර්ථික විද්‍යාව, පෝෂණය, පවුල් සැලසුම් කිරීම, ගොවිජන නීතිය නෛතික සේවාවන්, සමුපකාරයන් හා ගොවිපල කළමනාකරණය පිළිබඳ පාඨමාලාවන්ට විශේෂයෙන් අවධාරණය කරමින් අවිධිමත් අධ්‍යාපනය පිළිබඳ වැඩසටහන් ශක්තිමත් කිරීම.

(iv) වෙනත් කරුණු අතර ග්‍රාමීය කර්මාන්ත, ගොඩනැගිලි හා උපකරණ නඩත්තුව සඳහා අවශ්‍ය නිපුණතා දියුණු කිරීම සඳහා අවිධිමත් අධ්‍යාපනය ශක්තිමත් කිරීම

(v) සේවා නියුක්තීන් දියුණු කිරීමත්, ප්‍රජාවගේ ස්ව ශක්තීන් ඉහළ නැංවීමත් සඳහා ස්ථානීය ද්‍රව්‍යමය පාවිච්චිය පිළිබඳ පුහුණුව හා පහල මට්ටමේ අධ්‍යාපනය දියුණු කිරීම.

(vi) පාසැල් තුළ හා පාසැලෙන් පිටත අධ්‍යාපනයේ සම්බන්ධීකරණයට අනුබල දීම හා මෙම පද්ධතියේ අනුකලනය දියුණු කිරීම.

(ආ) සංවර්ධන පිරිස්වල අවබෝධය පුළුල් කිරීම

(i) රජයේ නිලධාරීන්, ප්‍රතිපත්ති සම්පාදකයන් සහ පරිපාලකයන්, ශිල්පීන් සහ අධ්‍යාපනඥයන්, විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශයන්හි තත්ත්වයන් හා ගැටලු පිළිබඳ ඔවුන්ගේ අවබෝධයන් ග්‍රාමීය දිළින්දන්ගේ අවශ්‍යතාවන්ට දැක්වීමට ඔවුන්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා නැවත පුහුණු කිරීම හා නැවත හැඩ ගැස්වීම ඇතුළුව,පුරුෂයන් හා ස්ත්‍රීන් සඳහා සහ කොන්දේසිමත අඛණ්ඩ අධ්‍යාපන වැඩ සටහන් ඇති කිරීම සහ ශක්තිමත් කිරීම.

(ii) සියලු විසඳීම හා ස්ථානිය තත්ත්වයන්ට හැඩ ගැසීමත් පිළිබඳ අවදාරණය කරමින්, ප්‍රායෝගික අත්දැකීම් වලින් ප්‍රයෝජන ගනිමින්,කෘෂිකර්මය, වන සංරක්ෂණය සහා ධීවර කර්මාන්තය පිළිබඳ විශේෂයෙන්ම මේ අධ්‍යාපනය සහ ව්‍යාප්ති පුහුණුව පුලුල් කිරීම.

(iii) ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන් පිළිබඳ අරමුණු සැලැස්ම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සංවර්ධන සැලසුම් කරුවන්, ග්‍රාමීය අධ්‍යාපනය ගැනත්, ව්‍යාප්ති සේවකයන්, හා පුලුල් පදනමක් සහිත ජනතා සංවිධානයන් හි සාමාජිකයන් අතරඅන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය සහ සම්පාදනය වැඩි කිරීම.

(iv) ස්ත්‍රී සහ පුරුෂ \ව්‍යාප්ති සහ පර්යේෂණ සේවකයින් හා ග්‍රාමීය අධ්‍යාපනඥයන්, ග්‍රාමීය පුහුණුවන්නන් බඳවා ගැනිම හා ඔවුන්ගේම ප්‍රජාවන් තුළ වැඩ කිරිම සඳහා ආපසු යාමට ඔවුන්ට අනුබල දීම.

(v) පර්යේෂණ ආයතන, ව්‍යාප්ති ආයතන හා ගොවීන් අතර සංනිවේදනය හා අදහස් හුවමාරුව වැඩිදියුණු කිරිම හා පර්යේෂණ සහ ව්‍යාප්ති පුහුණු ප්‍රමුඛතාවන් හරවත් කර ගැනීමටත්,ගොවි ජනයාගේ අවශ්‍යතාවන්ට වඩාත් ප්‍රතිචාර දක්වන සුලු පහල මට්ටමේ අධ්‍යාපන සහ පුහුණුවැඩ සටහනක් පිලියෙල කර ගැනීමටත්, ගොවි කණ්ඩායම් වල නියෝජිතයන්ගේ සහභාගීත්වය පිළිබඳ ක්‍රම පිළියෙළ කර ගැනීම

(vi) උචිත මූලික ග්‍රාමීය තාක්ෂණය, පෙරමුණ සහ ශිල්පියන් පැතිර වීම සඳහා කේන්ද්‍රස්ථාන වශයෙන් සේවයකරනු පිණිස සහ ජාතික මධ්‍යස්ථාන ඵලදයක අන්දමින් ප්‍රයෝජනයට ගැනීම.

**ගොවිකටයුතු ප්‍රතිසංස්කරණ හා ග්‍රාමීය සංවර්ධනය සඳහා අන්තර්ජාතික ප්‍රතිපත්ති**

ආරක්ෂා කාරී ප්‍රතිපත්ති ද නිෂ්පාදන යෙදවුම් සහ තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික වෙළඳපලවල විකෘතීන්ද, ප්‍රමාණවත් නොවන ශිල්පීන් සහයෝගය සහ සම්පත් ගලයාම

ප්‍රමාණවත් නොවීම ද මැඩ පැවැත්වීම සඳහා අන්තර්ජාතික ආර්ථික සබඳතා පිළිබඳ වත්මන් ශ්‍රමයේ තවදුර දියුණුවක් මගින් ගොවිකටයුතු ප්‍රතිසංස්කරණය හා ග්‍රාමීය සංවර්ධනය ශක්තිමත් කරමින් ඊට ආධාර කිරීමත් කළ යුතු ය. සංවර්ධනයෙන් ලෝක ආර්ථික ක්‍රියාකාරීත්වයට සංවර්ධනය වන රටවල සාධාරණ සහභාගීත්වය ඇතිකිරීම සඳහා සැලසුම් කරන ලද නව අන්තර්ජාතික ආර්ථික පටිපාටින් ග්‍රාමීය සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තියන්ගේ සාර්ථකත්වය සඳහා අවශ්‍යය.

### *VIII අන්තර් ජාතික වෙළඳම*

විශේෂයෙන්ම සංවර්ධනය වන රටවල අමු හා සකසන ලද කෘෂිකාර්මික භාන්ඩවලට කාර්මිකකරණය කරන ලද වෙළඳපල වලට ඇතුළු වීමේ ඉඩකඩ වැඩි දියුණු කිරීම සඳහාත්, වෙළඳපල ස්ථාවරභාවය හ නොකඩවා පුලුනල් වන වෙළඳ හා ඉපයුම් මට්ටම් සහතික කිරීම සඳහාත්, ග්‍රාමීය සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහාත් කළ යුතු වැදගත් සම්මාදමක් කිරීමට අන්තර්ජාතික වෙළඳාමේ වෙනස් වීම් වලට හැකිය.

අන්තර්ජාතික වෙළඳ පද්ධතීන් සමානත්වය, ස්වෛරීභාවය හා අභ්‍යන්තර කටයුතු වලට ඇඟිලි නොගැසීමේ ප්‍රතිපත්ති මත පදනම් විය යුතු ය. සංවර්ධනය වන රටවල විදේශ වෙළඳ ප්‍රතිපත්ති හි ග්‍රාමීය සං වර්ධනයත්, ග්‍රාමීය දිළිඳුකම අඩු කිරීමත් පිළිබඳ අරමුණු දෙසට වඩා සෘජු ලෙස යොමු වියයුතු ය.

1980 ගණන්වල අන්තර් ජාතික සංවර්ධන උපාය මාරගයට ලෝක ග්‍රාමීය සංවර්ධන උපාය මාර්ගයන් අවශ්‍යය . මේ අරමුණු උදෙසා සංවර්ධිත රටවල ආණ්ඩු පහත සඳහන් කාර්යයන් සඳහා වරින්වර ගත යුතු ය.

**(අ.) වෙළඳපල වලට ඇතුළුවීමේ ඉඩකඩ සහ භාණ්ඩ ගිවිසුම්.**

(i) වෙළඳම ලිහිල් කිරීම අරමුණු කොටගත් සියලු පොරොන්දු ඉක්මනින් හා නොවලහා ක්‍රියාත්මක කිරීමට භාර ගැනීම හා අරක්ෂණ වාදයට ප්‍රතිරෝධය දැක්වීමට අලුත් වූ අධිෂ්ඨානයෙන් යුතුව නිසි අන්තර්ජාතික වේදිකා වල දී සංවර්ධනය වන රටවල් සමග ඒකාබද්ධව සාකච්ඡා පැවැත්වීමේ ක්‍රියාවලින් නොනවත්වා පවත්වාගෙන යාම.

(ii) සංවර්ධනය වන රටවලට විශේෂයෙන් වැදගත් වන අමු හා සකසන ලද කෘෂිකාර්මික හා ග්‍රාමීය නිෂ්පාදනයන් ඇතුළු වීමට ඇති තීරු බදු බාධක හා තීරු බදු නොවන බාධක ක්‍රමයෙන් අඩුකිරීම ඉවත් කිරීම දෙසට ගමන් කිරීම.

(iii) වරණ පිළිබඳ පොදු පද්ධතීන් සකසන ලද හා අර්ධ වශයෙන් සකසන ලද නිෂ්පාදිතයන් වඩාත් විශාල සංඛ්‍යාවකට හා හැකි සෑම තැනකදීම කෘෂි කාර්මික නිෂ්පාදනයන් වන ව්‍යාප්ත කිරීම හා සංවර්ධනය වන රටවල් අපනයන අවශ්‍යතා ඉටු කිරීම සඳහා තරගකාරී කෘත්‍රිම ආදේශකයනට විවෘතව හෝ සැහවුණු සහනාධාර ක්‍රම යොදා ගැනීම හා ආරක්ෂක

පියවරවල් කිසිදු විශේෂිත ආකාරයකින් ක්‍රියාත්මක කිරීමක් යටතේ අනීසි සීමා කිරීම් පැනවීමෙන් වැලකීම

(iv) සංවර්ධනය වන රටවල් සමග එක් වූ අන්තර් ජාතික භාණ්ඩ ගිවිසුම් හෝ අනෙක් වාසි ඒකාබද්ධ භාණ්ඩ වැඩසටහන් යටතේ සාකච්ඡා මගින් ඇතිකර ගන්නා ලද වැඩ පිළිවලට සහභාගී වීම හා ඉක්මනින් අනුගත වීම හා අදල අනෙක් වාසි යෝජනාවලට අනුකූලව ඉක්මන් දිනකදී භාණ්ඩ අරමුදල ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම සඳහා කටයුතු කිරීම.[1]

(v) වෙළඳපල වල ව්‍යුහාත්මක තත්ත්වයන් වැඩි දියුණු කිරීමත් භාණ්ඩයන්ගේ දීර්ඝ කාලීන තරඟකාරීභාවය හා ඉඩ ප්‍රස්ථා ඉහල නැංවීමත් අරමුණු කොට ගත් භාණ්ඩ සංවර්ධන පියවර වලට මුදල් සපයනු ඇති, භාණ්ඩ සඳහා වූ ඒකාබද්ධ වැඩ සටහන යටතේ පොදු අරමුදලක් මත එ.ජා. සාකච්ඡා සමුළුවේදී සම්මත කර ගන්නා ලද 1(III) යෝජනාවට අනුව අරමුදුල් සැපයීමේ සහ පොදු අරමුදලේ දෙවැනි කවුළුව ක්‍රියාත්මක වීමේ වැදගත් කාර්ය භාරය සහ ආධාරය හඳුනා ගැනීම.

(vi) ආනයන ලිහිල් කිරීමේ පියවර වල් නිසා විස්ථාපනය කරනු ලැබූ ගොවීන් හා ගොවි කම්කරුවන් සඳහා විකල්ප ආර්ථික ඉඩ ප්‍රස්ථා ඉල්ලා සිටින අන්තර් ජාතික කම්කරු සංගමයේ ලෝක සේවා නියුක්ති සමුළුවේ නිර්දේශිත ක්‍රියාත්මක කිරීම. මේ කාර්ය සඳහා ආණ්ඩු අන්තර්ජාතික් කෘෂිකාර්මික සැකසුම සඳහා වූ ආහාර සහ කෘෂි සංවිධාන මාර්ගෝපදේශ ක්‍රියාත්මක කළ යුතු ය.

(vii) සංවර්ධනය වන රටවලට වෙළඳම දියුණු කිරීම් ආධාර පිළිබඳ ක්ෂේත්‍රයෙහි ප්‍රවීනත්වයක් ඇති ජාතික හා ජාත්‍යන්තර සංවිධානවලට (විශේෂයෙන් උන්ක්ටාඩ්/ගැට්/අන්තර්ජාතික වෙළඳ මධ්‍යස්ථානය) මූල්‍ය සහ ආර්ථික ආධාර වැඩි කිරීම; සංවර්ධනය වන රටවල ආණ්ඩු පහත දැක්වෙන කාර්යයන් සඳහා පියවර ගත යුතු ය.

(ආ). සුළු නිෂ්පාදකයන් සඳහා සාධාරන කොන්දේසි

(i) අමු හා සකසන ලද කෘෂිකාර්මික භාණ්ඩ අපනයනයන් අධෛර්ය කරන යම් විශේෂ මූල්‍ය පියවරවල් (වෙනස්කම් කරන සුළු විනිමය අනුපාතිකයන්, අපනයන බදු, වෙනත් මූල්‍ය ප්‍රතිපත්ති) වේ නම් සාධාරණ හා කාර්යක්ෂම භාවයේ දෘෂ්ඨී කෝණයෙන් ඒවා ප්‍රවේශමෙන් පරීක්ෂා කොට බලා අසාධාරණයන් ද විශේෂයෙන් ම සුළු නිෂ්පාදකයන්හට නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වූ බාධකයන් ද ඉවත් කිරීම.

---

1. අංක 93 (IV) හා 124 (V) යෝජනා හා භාන්ඩ සඳහා ඒකාබද්ධ වැඩ සටහන පිළිබඳ යෝජනාව (III) යටතේ පොදු අරමුදලක් පිළිබඳ රක්සත් ජාතික සාකච්ඡා සමුළුව.

(ii) අන්තර්ජාතික වෙළඳපල වල වාසිදායක අන්දමින් මිල වෙනස්වීම් වලින් ලැබෙන ප්‍රතිලාභ සුළු නිෂ්පාදකයන් වෙත සාධාරණ ලෙස ලැබීමත් අධිජාතික වෙළඳ සමාගම් සහ ආණ්ඩු එම ලාභ නොවැලැක්වීමත් සහතික කිරීම.

(iii) සුළු නිෂ්පාදකයන්ට ඔවුන්ගේ නිෂ්පාදනයන් සඳහා විදේශීය වෙළඳපල වල ඉඩ ප්‍රස්ථාවන් සම්බන්ධයෙන් තොරතුරු පැතිරීම, ශක්තිමත් කිරීම එබඳු ඉඩ ප්‍රස්ථා හඳුනා ගැනීම සහ ඒවායින් ප්‍රයෝජන ගැනීම සාහ විශේෂ අලෙවි ආයතන (උදා, සමුපකාරයන්) ඇතිකිරීම, තමන්ගේම හෝ ජාතික හෝ ව්‍යවසායකයන් මගින් සුළු ගොවින් ඇතුළු නිෂ්පාදකයින්ට කෙලින්ම ඇතුළු වීමට ආධාර වන සංවිධානාත්මක හා ශිල්පීන් තත්වයන් ස්ථාපිත කිරීම හා සංවර්ධනය වන රටවල නිෂ්පාදකයන්ගෙන් හා පාරිභෝජක රටවල ගැනුම්කරුවන් අතර සෘජු වෙළඳ සම්බන්ධතා දියුණු කිරීම.

(iv) සුළු නිෂ්පාදකයන්ගේ හා කෘෂිකාර්මික කම්කරුවන්ගේ ආදයම් අන්තර් ජාතික මිල තදින් උස්පහත් වීම් වලින් ආරක්‍ෂා කිරීම සඳහා අන්තර්ජාතික මූල්‍ය හා වෙනත් ආධාර පාවිච්චි කළ හැකි ක්‍රම සොයාගැනීම. උදහරණයක් වශයෙන් ජාතික මිල හා ආදායම් සහනාධාර සැපයීමේ අරමුදල් ඇති කිරීම හා ආධාරක මිල ගණන් ස්ථාපිත කිරීම

(v) රටතුල එක්වන වටිනාකමත්, එමගින් ග්‍රාමීය ජනතාවට, විශේෂයෙන් සුළු භෝගවලට ලැබෙන ප්‍රතිලාභ වැඩි කිරීම සඳහා ස්ථානීය කෘෂිකාර්මික අපනයන භෝගයන් ස්ථානීයව සකස් කිරීම දියුණු කිරීම සඳහා ඉඩ ප්‍රස්ථා හඳුනා ගැනීම සහ ආධාර කිරීම

(vi) අපනයන භෝග සඳහා වෙන් කෙරුනු ලබන ඉඩම් වැඩිවීම නිසා ආහාර සැපයුම් අඩු වීමටත් පෝෂණ තත්ත්වයේ පිරිහීමටත් හේතු නොවන බව සහතික කිරීම.

## *IX සංවර්ධනය වන රටවල් අතර ආර්ථික හා ශිල්පීය සහයෝගය*

ග්‍රාමීය සංවර්ධනයට බලපාන කටයුතු සම්බන්ධයෙන් සංවර්ධනය වන රටවල් අතර ආර්ථික සහ ශිල්පීය සහයෝගීතාවය පුළුල් වියයුතු ය. සංවර්ධනය වන රටවල ඇමති සමුළුවල දී එකඟ වන ලද අරමුණු සහ කාර්ය වැඩ සටහන් සිහිපත් කරමින් ද එ.ජා මහා මණ්ඩලයේ වෙළඳම හා සංවර්ධනය පිළිබඳ එ.ජා. සමුළුවේත්, සංවර්ධනය වන රටවල් අතර ශිල්පීන් සහයෝගය පිළිබඳ බුවනෝර්ස් අයර්ස් කාර්ය සැලැස්මේත්, අදල යෝජනා වලට ද ආහාර, හා කෘෂිකර්මය සම්බන්ධයෙන් සංවර්ධනය වන රටවල් අතර ආර්ථික සහයෝගය පිලිබඳ අ.කො.ස ශිල්පීන් විමසුමේ නිර්දේශ වලට ද (1979) අනුකූලව එම සහයෝගය දියුණු කළ යුතු ය.

සංවර්ධනය වන රටවල් අතර සහයෝගය පුළුල් කිරීම සඳහාත් අන්තර්ජාතික වෙළඳපල වල කෘෂිකාර්මික නිෂ්පාදිත සඳහා වූ වෙළඳ කොන්දේසි වැඩි දියුණු කිරීම

සඳහාත් ඒකාබද්ධ පියවර වල් ගත යුතු ය. කෘෂිකාර්මික තාක්ෂණය, ආයතනික ප්‍රතිසංස්කරණ සහ ග්‍රාමීය සංවර්ධන සැලසුම් පිළිබඳ දැනුම හා අත්දැකීම් හුවමරු කරගැනීමේ දී දැනට වඩා වැඩි සහයෝගයක් සඳහාත් බොහෝ ඉඩ ප්‍රස්ථා ඇත.

මේ ඉඩ ප්‍රස්ථා තවදුරටත් සොයා බැලීම හා ඒවායින් ප්‍රයෝජන ගනු පිණිස සංවර්ධනය වන රටවල ආණ්ඩු පහත දැක්වෙන කාර්යයන් සඳහා පියවර ගැනීම පිළිබඳව සලකා බැලිය යුතු ය.

(i) නිෂපාදනය, සැකසීම හා කෘෂිකාර්මික නිෂ්පාදනයන්ගේ අවසාන ප්‍රයෝජන පිලිබඳ පර්යේෂණ සම්බන්ධයෙන් සුලු ගොවීන් හා කුලීකරුවන් ඇතුළු නිෂ්පාදකයන් ද ඉඩම් නැති කම්කරුවන් හා ඔවුන්ගේ සංවිධාන ද අතර ඔවුන් ගේ සහයෝගය ස්ථාපිත කිරීම.

(ii) ලෝක වෙළඳපල වල සැපයුම හා ඉල්ලුම අතර, අනාගත අසමතුලිතයන් වැලැක්වීම සඳහා ඒ ඒ භාණ්ඩ වෙළඳපලවල් සඳහා අනාගත ඉඩ ප්‍රස්ථා ගැන තොරතුරු හුවමාරු කිරීම හා හැකිතාක් දුරට ජාතික නිෂ්පාදන ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කිරීම හා නිෂ්පාදකයන්ට ලැබෙන ප්‍රතිඵල වැඩි දියුණු කිරීම.

(iii) පර්යේෂණ හා පුහුණුව සඳහා ප්‍රාදේශීය ආයතන පිහිටුවීම හා ශක්තිමත් කිරීම ද ඇතුළුව ගොවි කටයුතු ප්‍රතිසංස්කරණය හා ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේදී ලත් අත්දැකීම් හා විශේෂ දැනුම් හුවමාරුව ජාතික ආයතනයන් අතර දියුණු කිරීම

(iv) කෘෂිකර්මය ග්‍රාමීය කර්මාන්ත, බල ශක්ති ගොඩනැගීම, ග්‍රාමීය සංවර්ධනයට අදල වෙනත් විෂයයන් හා පොදු සේවා ව්‍යුහයේ වෙනත් අංග සඳහා වූ තාක්ෂණය හුවමාරුවක් ජාතික පර්යේෂණ ආයතනයන් මගින් දියුණු කිරීම

(v) සංවර්ධිත රටවලින් ආනයනය කළ හැකි ක්‍රම හා විසඳුම් වලට වඩා උචිත ක්‍රම හා විසඳුම් ගැනීමට ස්වාභාවික තත්වයන්ගේත් සමාජක්‍රම වලත් සමානකම් වල ඇති ඉඩකඩ නිසා සංවර්ධනය වන රටවල් අතර තාක්ෂණයන් හුවමාරුව සඳහා වඩා ඵලදයක හැකියාවක් ඇති කර ගැනීම.

(vi) වාරිමාර්ග හා දිය බෙත්ම කළමණාකරනය වැනි අන්තර් රාෂ්ඨීය ග්‍රාමීය ව්‍යාපෘති දියුණු කිරීම හා එබඳුම ව්‍යාප්ති පාලනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඒවා සඳහා මූල්‍ය ආධාර සෙවීම.

(vii) රටවල් අතර ලාභයන් සාධාරණ ලෙස බෙදීම සහතික කිරීම සහ සංවර්ධන ඌන පුරුකත්වය මනා බව ගැන තිසි සැළකිල්ල දක්වමින්, ප්‍රාථමික නිෂ්පාදන මත පදනම් වූ සැකසුම් හා නිෂ්පාදන කටයුතු සම්බන්ධයෙන් නිෂ්පාදන රටවල් අතර සෑම ආකාරයෙන්ම විශේෂීකරණය දියුණු කිරීමත්

එකී රටවල් අතර ඉතාමත් පීඩිත රටවල සාපේක්ෂ තත්ත්වය වැඩි දියුණු කිරීම

උන්ක්ටාඩ් සංවිධානයේ 182 යෝජනාවේ අදල කොටස් වලට අනුකූලව, සංවර්ධනය වන රටවල් අතර ආර්ථික හා ශිල්පීය සහයෝගය දියුණු කිරීමට සංවර්ධිත රටවල් සහ අදල අන්තර්ජාතික සංවිධාන විශේෂයෙන් එක්සත්ජාතීන්ගේ පද්ධතිය තුළ ඇති සංවර්ධන ආධාර, අත්දැකීම් හා විශේෂ දැනුම් හුවමාරුව ජාතික ආයතනයන් අතර දියුණු කිරීම

සංවර්ධනය වන රටවල දැන්ම, තොරතුරු හා අත්දැකීම් එක් රැස් කිරීමෙන් හා සංවර්ධනය වන රටවල් අතර එම කරුණු පැතිර වීමෙහි ලා එ.ජා. පද්ධතියේ අල සංවිධානාත්මක හා වෙනත් අන්තර් ජාතික සංවිධානයන් ඉටුකරනකාර්ය භාරය ශක්තිමත් කළ යුතු ය.

***X විදේශ ආයෝජන***

ගොවි කටයුතු ප්‍රතිසංස්කරණය හා ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ අරමුණු බලවත් සංවර්ධනය වන රටවල් තුළ දේශීය ආයෝජනයේ කටයුතු, විශේෂයෙන් අධිජාතික කෘෂි කර්මාන්ත සමාගම්වල කටයුතු සමස්ථ අර්ථික හා සමාජ සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට බාධාවක් නොවන බව සහතික කිරීමත්, තමන්ගේ ජාතික ප්‍රතිපත්ති හා ප්‍රමුඛතා තීරණය කිරීමට එක් එක් රට සතුව ඇති අයිතීන්ට පූර්ණ සැළකිල්ල දක්වමින් ජාතික හා අන්තර් ජාතික පියවර ගැනීම අවශ්‍යය.

අවශ්‍ය විශේෂිත අන්තර් ජාතික සංවිධානයන්ගේ ආධාර ඇතිව එම අයෝජනයන් ගේ සම්පත් ක්‍ෂයවීම මගින් පරිසර විද්‍යාත්මක බලපෑම් වලට ස්ථානීය ඕනෑකම් වලට උචිත තාක්‍ෂණ අවශ්‍යතාවලටත් විශේෂ අවධානය දැක්විය යුතු ය.

විදේශීය ආයෝජනය හා අධිජාතික සමාගම් සම්බන්ධයෙන් ගොවි කටයුතු ප්‍රතිසංස්කරණය සහ ග්‍රාමීය සංවර්ධනය සඳහා වූ උපාය මාර්ගයන්ට පහත දැක්වෙන අරමුණු සඳහා පියවරවල් ඇතුළත් විය යුතුය.

(i) ආර්ථික අයිතිවාසිකම් හා රාජ්‍යයන්ගේ යුතුකම් පිළිබඳ ප්‍රඥප්තියට අනුකූලව උචිත වන්දි සඳහා විධි විධාන සහිතව දේපල ජනසතු අයිතිය ද ඇතුළුව, තමන්ගේ සියළු ස්වාභාවික වූ හා මිනිසා විසින් තනන ලද සම්පත් පිළිබඳ අයිතිය, ඒවා පාය හා ඒවාට හිස්සක් කිරීම සම්බන්ධ සම්පූර්ණ සෛවරීභාවය පාවිච්චි කිරීමට එක් එක් රාජ්‍යය සතු අයිතිය නැවත ප්‍රකාශ කිරීම.

(ii) අධිජාතික සමාගම් හා විදේශීය ආයෝජකයන් සමග සමාන පදනමකින් සාකච්ඡා කිරීමට හෝ නැවත සාකච්ඡා කිරීමට සංවර්ධනය යන රටවලට ශිල්පීය හා පරිපාලන හැකියාව ලබාදීමේ අරමුණ ඇතිව අන්තර් ජාතික ආයතනයන්ගේ ආධාරය ඇතිව සංවර්ධනය වන රටවල, රටවල් තුළ සංවිධානයන් ශක්තිමත් කිරීම හා අවශ්‍ය නම් පිහිටු වීම.

(iii) අධි ජාතික සමාගම් වලත් ග්‍රාමීන් ව්‍යවසායන්හි ආයෝජනයන් කරන වෙනත් විදේශීය ආයෝජකයන් ගේත් කටයුතු ග්‍රාමීන් සංවර්ධනයේත්, ගොවිකටයුතු ප්‍රතිසංස්කරණයේත් ජාතික අරමුණු වලට අනුකූල බව සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සහතික කිරීම.

(iv) අධි ජාතිකසමාගම් සඳහා අන්තර් ජාතික නීති සංග්‍රහයක් ස්ථාපිත කිරීම සඳහා වූ එ.ජා ගේ ප්‍රයත්නයන්ට ආධාර දීම.

(v) විශේෂයෙන්ම කෘසිකාර්මික නිෂ්පාදනය සැකසීම හා අලෙවින් පරිසර විද්‍යාත්මක ආරක්ෂාව සහ ග්‍රාමීය සංවර්ධනය සම්බන්ධයෙන්, අධිජාතික සමාගම්වල කටයුතු වල ප්‍රතිවිපාකයන් හා එම සමාගම්වල ව්‍යවහාරයන් සම්බන්ධයෙන් නොකඩවා තොරතුරු හුවමාරු කර ගැනීම පිණිස අධි ජාතික සමාගම් පිළිබඳ එ.ජා. මධ්‍යස්ථානය තුල අංග සම්පූර්ණ තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීමට ආධාර දීම.

(vi) කෘෂි කර්මය තුළ හා විදේශීය අයෝජනයය සඳහා වූ භෝගයන් ගොවි කටයුතු ප්‍රතිසංස්කරණය හා ග්‍රාමීය සංවර්නය කෙරෙහි බලපාන අන් කටයුතුත් ඇගැයීම සඳහා ජාතික විශේෂඥතාවයෙහි සංවර්ධනය ඉක්මන් කිරීම සහ ජාතික අවශ්‍යතා, ප්‍රමුඛතා සහ අරමුණු සමග ගැලපෙන ආයෝජන වැඩසටහන් සහ ව්‍යාපෘතීන් පිළියෙල කිරීමේදී අනාගත ආයෝජකයන් විය හැකි අන් අය සමග ඒකාබද්ධව ක්‍රියා කිරීම.

(vii) අධි ජාතික සමාගම් වලට අදල වත්මන් එ.ජා. ගේ ප්‍රයත්නයන් විදේශීය ආයෝජකයන්ගේ මෙහෙයුම් තක්සේරු කිරීම පිණිස ග්‍රාමීය දිළින්දන්ට විශේෂයෙන් යහපත් වන ග්‍රාමීය සංවර්ධනය කෙරෙහි ඒවායේ හිතකර බලපෑම වැඩිකරනු සඳහා අවශ්‍ය තැන්වල දී ඒ ඒ රටේ විශේෂ තත්වයනට ගලපනු ලබන, මිනුම් දඬු කට්ටලයක් පිළියෙල කිරීම දෙසට යොමු කිරීම.

මේ මිනුම් දඬු නිරීක්ෂණය කිරීමට අවශ්‍ය වන ප්‍රතිපත්ති, රෙගුලාසි සහ වෙනත් මිනුම් ක්‍රම වලට අනුබල දීම

### *XI සංවර්ධන ආධාර*

තිල ද්විපාක්ෂික හා බහු පාක්ෂික මාර්ගඔස්සේ දෙනු ලබන සංවර්ධන ආධාර වල ප්‍රමාණය හා කොන්දේසි ගොවිකටයුතු ප්‍රතිසංස්කරණය හා ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ අරමුණු ඉටුකර ගැනීම සඳහා සංවර්ධනය වන රටවල් විසින් දරනු ලබන ජාතික ප්‍රයත්නයන්ට අතිරේකයක් වශයෙන් බෙහෙවින් වැදගත් ය. ආධාර දෙන රටවල් මෙන්ම ලබන රටවල් ද කෘෂිකාර්මික හා ග්‍රාමීයසංවර්ධනය සඳහා වූ සම්පත් වල ප්‍රමාණය හා අනුපාතය පුළුල් කිරීමට උත්සාහ කළ යුතුඅතර විශේෂයෙන්ම ගොවිකටයුතු ප්‍රතිසංස්කරණ වැඩසටහනක් සඳහා සෘජු ආධාර දීම පිළිබඳව සලකා බැලිය යුතු ය.

සංවර්ධිත හා සංවර්ධනය වන රටවල් ද අන්තර්ජාතික ආයතන ද අතර සහයෝගයට පහත සඳහන් අරමුණු සඳහා පියවර ගැනීම ඇතුළත් විය යුතු ය.

(i) මේ කාර්ය වැඩසටහනෙහි දැක්වෙන අරමුණු සහ ඉලක්කයන් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය සංවර්ධන සම්පත් සැලකියයුතු අන්දමින් වැඩි කිරීම මගින් සංවර්ධනය වන රටවලට ආධාර සැපයීම.

(ii) දෙවැනි සංවර්ධිත දශකය සඳහා ස්ථාපිත කරන ලද,දල ජාතික නිෂ්පාදනයෙහි 0.7%ක නිල දළ සංවර්ධිත ආධාර ඉලක්කය කරා ළඟා වීමට සංවර්ධිත රටවල් හදිසි පියවර ගැනීම

(iii) නිල ආධාර පිළිබඳ ප්‍රමාණය, ගුණය හා කොන්දේසි සම්බන්ධයෙන්,19 වැනි රැස්වීමේදී එකඟ වන ලද, එ.ජා ගේ මහා මණ්ඩලයේ සමස්ථයේ කමිටුවේ නිගමනයන් ද ආහාර ආධාර, ආහාර සුරක්ෂිත තාව, සම්පත් ගලා යාම හා පෝෂණ වැඩසටහන් සම්බන්ධයෙන් එහි 27 වෙනි රැස්වීමේදී එළඹුනු නිගමනයන්ද ක්‍රියාත්මක කිරීම සඳහා ආධර දෙන රටවල් හදිසි පියවර ගැනීම.

(iv) ග්‍රාමීය සංවර්ධනයටත් ග්‍රාමීය දිළිඳුකම අඩු කිරීමටත් ආධාර කිරීමටත් බැඳී සිටින අන්තර්ජාතික මූල්‍ය ආයතනයන් ගේ සම්පත් පාවිච්චියේ ප්‍රමාණය ඵලදයක භාවය වැඩිකිරීම හා ඒවායේ සහනදායී ණය සම්පත් වරින් වර නැවත දීමෙන් එම ආයතන වල මූල්‍ය ශක්තිය සහතික කිරීම විශේෂයෙන්ම කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික අරමුදලේ සම්පත් අඛන්ඩ පදනමක් මත නැවත ලබා දිය යුතු අතර එම අරමුදලේ පාලක මණ්ඩලය එහි සම්පත් සැබවින් ම වැඩි කිරීමේ අවශ්‍යතාවන් ගැන සලකා බැලිය යුතුය.

(v) ග්‍රාමීය සංවර්ධනයට මුදල් සැපයීම සඳහා වැඩි නම්‍ය මිනුම් දඬු දෙසට පහත දැක්වෙන පරිදි ගමන් කිරීම (අ) දිළිඳුකම දෙසට යොමු වූ උපාය මාර්ගයන් යටතේ ගොවිකටයුතු ප්‍රතිසංස්කරණය හෝ ග්‍රාමීය සංවර්ධනය හෝ පිළිබඳ ව්‍යාපර නැතහොත් වැඩසටහන් ඒවායේ ප්‍රමාණය හෝ ස්වභාවය කුමක් වුවත් විදේශීය ආධාර ලැබීම සුදුසු හැටියට සැලකිය යුතු ය. (ආ) තෝරා ගැනීමේ මිනුම් දඬු වලට සංවර්ධනය හා දිළිඳු කම කෙරෙහි සෘජු හා අනියම් බලපෑම් ඇතුළත් විය යුතු ය (ඇ) අංශයන් අතර හා ඇතුළත ව්‍යාපෘතින්ගේ ඌනපූරකත්වයට වඩා විශාල අවධානයක් යොමු කළ යුතු ය. (ඇ) ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති හඳුනා ගැනීමේ, සැලසුම් කිරීමේ සහ කළමණාකරණයෙහි ස්ථානීය හැකියාව වැඩිකිරීමට පුද්ගලයින් පුහුණු කිරීමට හා සැලසුම් ඒකකයන් ඇති කිරීමට වඩාත් අවධාරණය කළ යුතු ය. (ඉ) ග්‍රාමීය සංවර්ධනයෙහි ආයෝජනය සඳහා ඇති සංඛ්‍යාව පොදුවේ උනන්දුවන අංශයන්හි බහු පාක්ෂික හා ජාතික ආයතනයන් විසින් හවුලේ අරමුදල් සැපයීම වඩාත් පාවිච්චි කිරීමෙන් දියුණු කළ යුතු ය.

(vi) විශේෂයෙන් අඩුවෙන් සංවර්ධිත හා අර්ධ සංවර්ධනය වඩාත්ම බරපතල ලෙස බලපෑනු ලැබූ රටවල් සම්බන්ධයෙන්, ආධාර දෙන්නන් (අ) දේශීය හා විදේශීය විනිමය වියදම් සඳහාත්, (ආ) ප්‍රාග්ධන වියදම මෙන්ම පුනරාවර්තන වියදම සඳහාත් (ඇ) ව්‍යාපෘති ආරම්භය සමග සසඳන කල වැඩ සටහන් හා අංශීය ආධාර පංගුව වැඩිකිරීම සඳහාත් මුදල් සැපයීමට සූදානම් විය යුතු ය. ව්‍යාපෘති චක්‍රය එක් කිරීම සඳහා ආයෝජන පූර්ව අධ්‍යාපනයන් ද ව්‍යාපෘති පිළියෙළ කිරීමටත් වැඩියෙන් අවධානයක්ද දිය යුතුය.

(vii) වඩා ක්‍රියාශීලී ජනතා සහභාගීත්වයත් ප්‍රතිලාභ ලබන්නන්ගේ අවශ්‍යතා කෙරෙහි වැඩි සංවේදී භාවයක් ස්ථානීය ආනයන ශක්තිමත් කිරීමත් අරමුදල් වඩා සීඝ්‍රයෙන් ලබාගත හැකි වීත් ආධාරවඩා ඉක්මනින් උකහා ගැනීමට හැකිවීමත් සඳහා, සුලු පරිමාන ග්‍රාමීය සංවර්න ව්‍යාපෘතීන් ගැන ක්‍රියා කිරීමේ පටිපාටි ප්‍රතිශෝධනය කළ යුතු ය.

(viii) මහා පරිමාණ වාරිමාර්ග හා ප්‍රවාහන ව්‍යාපෘති වැනි ප්‍රධාන පෙලේ පොදු සේවා ව්‍යුහ කර්මාන්තයන් සඳහා විදේශීය මුදල් ලබා ගැනීමේ අවශ්‍යතාව නිසා තිසි වැදගත් කමක් දෙන බව සහතික කිරීම

(ix) උන්ක්ටාඩ් වෙළඳ හා සංවර්ධන මණ්ඩලය මගින් එහි 9 වැනි විශේෂ සැසි වාරයේ දී සම්මත කරන ලද යෝජනාවෙන් එකඟ වෙන ලද පරිදි තිල සංවර්ධන ආධාර ණය සම්බන්ධයෙන් වන පියවරවල් ඉක්මනින් හා සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම

(x) ස්වශක්තිය ඇති කරන්නා වූත්,ඉඩම්නැති සේවා නියුක්ත හා ඌන සේවා නියුක්ත ජනයාහට ප්‍රමාණවත් නිත්‍ය ආදයම් පිළිබඳ වැඩි සහතිකයක් ලබා දෙන්නා වැනි වැඩ සටහන් වලට හා ව්‍යාපෘති වලට සංවර්ධන ආදයමෙන් වඩා විශාල කොටසක් යොමු කිරීම

(ix) දිළිඳුකමට යොමු වුනු හා ග්‍රාමීය සංවර්ධන උපාය මාර්ගයන්ට බලවත් වැඩි වැඩි වැදගත් කමක් දෙන හා පවත්නා වූත් කැපවීමක් අති බව පෙන්නුම් කර තිබෙන රටවලට ආධාර වෙන් කිරීමේ දී විශේෂ අවධානයක් දැක්වීම.

(xii) (අ) ඉඩම් මැණීම, ඉඩම් වාර්තා ස්ථාපිත කිරීම, නිති සේවා සැපයීම ආදිය ඇතුළු.ගොවිකටයුතු ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ හා පරිපාලනය කිරීමේ පියවරවල් (ආ) නිෂ්පාදනයෙහි, යෙදවුම් හා සේවාවන් සැපයීමෙහි හා අලෙවියේ සහ ගබඩා කිරීමෙහි අවුල්, කිසිවක් ප්‍රතිසංස්කරණයෙන් පසු ඇතිවුවහොත් ඒ සඳහා වන අතියම් වියදම්. (ඇ) සුලු ගොවීන් හා ඉඩම්නැති ජනයාට ගොවි කටයුතු ප්‍රතිසංස්කරණ වැඩසටහන් යටතේ බෙද දෙන ලද, අතිරේක ඉඩම් වැඩි දියුණු කිරීම (ආ) පරිසර අධ්‍යාපනය සහ පර්යේෂණ හා පරිසර ආරක්ෂාව පිළිබඳ නීති සූදනම් කිරීමේ වැඩ සටහන.

(xiii) පරිවර්තනීය කාලයේ දී දේශීය නිෂ්පාදනයෙන් සිදුවන යම් බැස්මක් පිරිමසා ගැනීම සඳහා ගොවිකටයුතු ප්‍රතිසංස්කරණ පිළිබඳ ක්‍රමානුකූල වැඩසටහනක් පටන් ගන්නා රටවලට නියමිත කාලයක් සඳහා ආහාර ආධාර හා වෙනත් උපකාර සැපයීම ගැන සලකා බැලීම.

(xiv) ආහාර ආධාර නිත්‍ය පදනමකින් ලැබෙන විට ස්වශක්තිය සමග නොගැටෙන බවත්, දේශීය නිෂ්පාදනය ගැන උනන්දුව අඩුවීම අවම කෙරෙන ආකාරයකින් එක් උකහා ගනු ලබන බවත්, බෙදා හැරීමේ දී සාධාරණය හා කාර්යක්ෂමතාව පවත්වනු ලබන බවත්, අඩු ආදායම් සහිත කණ්ඩායම් වලට ආහාර සැපයීම ස්ථාවර කෙරෙන බව සහතික කිරීම.

## *XII ආහාර සහ කෘෂිකර්ම සංවිධානය හා එක්සත් ජාතීන්ගේ පද්ධතියේ වෙනත් සංවිධාන සඳහා කාර්ය වැඩ සටහන*

මේ කාර්ය වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට ආධාර වනු පිණිස, ප්‍රධාන ආයතනය වශයෙන් ආහාර සහ කෘෂිකර්ම සංවිධානය ඇතිව නිසි අන්තර් ජාතික සංවිධාන ගොවි කටයුතු ප්‍රතිසංස්කරණය හා ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ක්ෂේත්‍රයේ පහත දැක්වෙන නිසි පියවරයන් සම්මත කිරීම ගැන සලකා බලන ලෙස සමුලුව නිර්දේශ කරයි.

**(අ.) ගොවිකටයුතු ප්‍රතිසංස්කරණය සහ ග්‍රාමීය සංවර්ධනය සමීක්ෂණය කිරීම**

(i) එක්සත් ජාතීන්ගේ පද්ධතියේ සංවිධාන, රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන මගින් සංගනය කරනු ලබන තොරතුරු ව්‍යාපාර මගින්, ග්‍රාමීය දිළිඳුකම පිළිබඳ යථාර්ථයටත් සංවර්ධිත රටවලින් සංවර්ධනය වන රටවල් දිළින්දන් ගේ යහපත පිණිස සම්පත් මරු කිරීම සඳහා ලෝකයේ කැපවීමක් අවශ්‍ය බවටත් සාමාජික රටවල් ජනගහනයන් සංවේදී කිරීමට ආධාර වෙයි.

(ii) ආහාර සහ කෘෂි සංවිධානය හා එක්සත් ජාතීන්ගේ පද්ධතියේ වෙනත් සාමාජික රටවල සහයෝගයෙන් ගොවි කටයුතු ප්‍රතිසංස්කරණය හා ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ දාර්ශනිකයන් විකාශනය කරයි. මේ කාර්ය වැඩ සටහනේ දැක්වෙන පරිදි ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ඒ ඒ ජාතික ඉලක්කයන් කරා සමීක්ෂණය කරනු සඳහා අදල තොරතුරු එකතු කිරීමට හා විශ්ලේෂණය කිරීමට ආධාර වෙයි.

(iii) ආහාර සහ කෘෂිකර්ම සංවිධානය හා එක්සත් ජාතීන්ගේ පද්ධතියේ වෙනත් සංවිධාන ද අන්තර් ලේකම් කාර්යාලීය යන්ත්‍රණය මගින් ග්‍රාමීය සංවර්ධනය සමීක්ෂණය කිරීම සහ ඇගැයීම සඳහා ක්‍රමද වැඩි දියුණු කරන ලද මිනුම් දඬු ද විකාශනය කරන අතර, ආණ්ඩුවල ක්‍රමානුකූල සමීක්ෂණ සහ ඇගැයී පටිපාටි හඳුන්වා දීමට ආධාර වෙයි.

(iv) එක්සත් ජාතීන් ගේ පරිසර වැඩසටහන, ආහාර සහ කෘෂිකර්ම සංවිධානය.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනු සංවිධාන සමග සහයෝගයෙන් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් වල ද ව්‍යාපෘති වල ද පරිසර බලපෑම් පිළිබඳ සමාලෝචනයක් හා ඇගයීම් සිදුකරන අතර පරිසර සමතුලනය හා පරිසර ආරක්ෂාව පිළිබඳ කරුණු ඒවායේ සැලැස්මට ඇතුල් කරයි.

(v) එක්සත් ජාතීන්ගේ පද්ධතියේ අනු සංවිධානයන්ද සමග එක්ව ආහාර හා කෘෂිකර්ම සංවිධාන ග්‍රාමීය සංවර්ධනය සඳහා දේශීය සහ විදේශීය සම්පත් ගලා ඒ පිළිබඳ සමීක්ෂණයන් සහ විශ්ලේෂණයන් කරන අතර අන්තර් ජාතික සංවිධානයන්ගේ තිසි පාලක මණ්ඩලයන් විසින් ඉල්ලුම් කරනු ලබන පරිදි වාර්තා සපයයි.

(vi) ආහාර හා කෘෂිකර්ම සවිධානය, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අන්තර් ලේකම් කාර්යාලයේ තිසි යන්ත්‍රණය මගින් එහි ප්‍රතිපත්ති, මේ කාර්ය වැඩසටහනේ දැක්වෙන අරමුණු හා ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමට කැපවුණු හා අදල රටේ විශේෂිත ඉල්ලීම පිට ඒ ඒ රටේ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කලින් කල (අ) අදල අන්තර් ජාතික සංවිධාන මගින් මේ ප්‍රයත්නයන්ට සපයනු ලබන සහයෝගයද සමාලෝචනය කරයි.

**(ආ) දැනුම විශ්ලේෂණය සහ පැතිරවීම**

(i) එක්සත් ජාතීන්ගේ පද්ධතියේ සංවිධාන ගොවි කටයුතු ප්‍රතිසංස්කරණය සහ ග්‍රාමීය සංවර්ධනය සඳහා වූ ජාතික ආර්ථික ප්‍රතිපත්ති පරිපාලනය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා යෙදවුම් හා සේවාවන් ලබාදීම පිළිබඳ ආයතන සුහසාධකඃ ජනතා සහභාගීත්වය විමධ්‍යගත කිරීම සහ දියුණු කිරීම, ප්‍රවාහනය හා සන්නිවේදනය, සෞඛ්‍ය සේවා හා අධ්‍යාපනය වැනි භෞතික හා සමාජ පොදු සේවා ව්‍යුහය සැපයීම, සල ගොවිතැන වැනි නිෂ්පාදන සංවිධානයේ විකල්ප ක්‍රම, නව තක්ෂණයේ සමාජ ආර්ථික බලපෑම, සුලු නිෂ්පාදනයන් සඳහාත් දිළින්දන් විසින් වවනු ලබන හා පරිභෝජනය කරනු ලබන භෝග සඳහා උචිත කාලගුණය : හා අහස් ජලයෙන් කෙරෙන කෘෂිකර්මයේ ගැටලු ඇතුළු, සමාජ ආර්ථික හා තාක්ෂණික පර්යේෂණ වලට සම්බන්ධ සාමාජික ආණ්ඩු හා වෙනත් අන්තර් ජාතික ආයතන සමග ඒක්සත් ජාතීන්ගේ පද්ධතියේ සංවිධාන එක්ව කටයුතු කරයි.

(ii) ආහාර හා කෘෂිකර්ම සංවිධානය හා එක්සත් ජාතීන්ගේ පද්ධතියේ වෙනත් සංවිධාන ආයතන හා භෞතික පහසුකම් අනුව සංවර්ධනය වන රටවල පර්යේෂණ සඳහා දේශීය හැකියාව ශක්තිමත් කරන අතර දිළිඳු කම අඩු කිරීමට අවධාරණයමත් ගොවිකටයුතු ප්‍රතිසංස්කරයේ සහ ග්‍රාමීය සංවර්ධනයේ ශිල්පීන් හා සමාජ ආර්ථික අංශ පිළිබඳ පර්යේෂණ දියුණු කරයි.

(iii) සංවර්ධනවන රටවල් ආහාර ආර්ථික සබඳතාසබන්ධයෙන් උත්ක්ටාඩ් සංවිධානයේ නිර්දේශයන්ට හා තීරණයන්ට අනුකූලව ආහාර හා කෘෂිකර්ම

සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ පද්ධතියෙ නත් සංවිධාන ගොවිකටයුතු ප්‍රතිසංස්කරණය සහ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ලෝක, කලාපීය සහ උපකලාපීය මට්ටමේ අත්දැකීම් හා විශ්ලේෂණයන් සංවර්ධනය වන රටවල් අතර හුවමාරු මට සලස්වයි.

(ඇ.) ශිල්පීය ආධාර කටයුතු

(i) ආහාර හා කෘෂිකර්ම සංවිධාන, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, රක්සත් ජාතීන්ගේ පද්ධතියේ අනෙක් සංවිධාන හා වෙනත් අදල අන්තර්ජාතික මුදල් ආයතන සංවර්ධනය වන රටවල විශේෂයෙන්ම මේ කාර්ය වැඩසටහන ක්‍රියාත්මක කිරීම දැතුළුව ගොවි කටයුතු ප්‍රතිසංස්කරණය හා ග්‍රාමීය සංවර්ධනය ද ඇතුළුව සියළු අංශයන්ගෙන් ආධාර පුළුල් කරයි.

(ii) ආහාර හා කෘෂිකර්ම සංවිධාන හා එක්සත් ජාතීන්ගේ පද්ධතියේ වෙනත් සංවිධාන. එක්සත් ජාතීන්ගේ තිසි අන්තර් ලේකම් මාණ්ඩලීය යන්ත්‍රණය මගින් ශිල්පීය ආධාර කටයුතු දිළිඳු ජනයාගේ අවශ්‍යතාවන්ට යොමු වී ඇති ප්‍රමාණය ද ඇතුළුව ගොවි කටයුතු ප්‍රතිසංස්කරණය සහ ග්‍රාමීය සංවර්ධනයට අදලබව එම කටයුතු වල තත්ත්වය හා ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනයක් හා විශ්ලේෂනයක් කරයි.

(iii) අධි ජාතිකසමාගම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මධ්‍යස්ථානය සමග එක්ව හා එක්සත් ජාතීන්ගේ පද්ධතියේ වෙනත් සංවිධාන සමග සහයෝගයෙන් ආහාර හා කෘෂිකර්ම සංවිධාන ඒවායේ ඉල්ලීමපිට, ගොවි කටයුතු ප්‍රතිසංස්කරණයට සහ ග්‍රාමීය සංවර්ධනය කෙරෙහි බාහිර පෞද්ගලික ආයෝජනයන් විශේෂයෙන් අධිජාතික සමාගම්වල ආයෝජනයන්ගෙන් බලපෑම ජාතික අරමුණු අනුව තක්සේරු කිරීමට ආධාර වෙයි.

(ඈ) සම්පත් ඒකරාශි කරගැනීමට ආධාර

(i) ආහාර හා කෘෂිකර්ම සංවිධානය දිළිඳු කම අඩුකිරීම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති ව්‍යාපෘතින් සහ වැඩසටහන් බලට විශේෂයෙන් අදලව සංවර්ධන ව්‍යාපෘතීන් හා ග්‍රාමීය සංවර්ධන පොදු හා පෞද්ගලික ආයෝජනයන් යෙදවීම සඳහා විපර්යාස කාරකයන් ලෙස ක්‍රියාකරයි.මේ රමුණ ඇතිව ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආයෝජන මධ්‍යස්ථානය ගොවි කටයුතු ප්‍රතිසංස්කරණ සහ ග්‍රාමීය සංවිධානයේ ආයෝජන ව්‍යාපෘති හඳුනාගැනිම හා හැඩ ගැස්වීමේ දී බහුපාක්ෂික හා ද්විපාක්ෂික මූල්‍ය ආයතනයන්ට ආධාර දීමට කේන්ද්‍ර ස්ථානයක් ලෙස දිගටම ක්‍රියා කළ යුතුය.

(ii) ආහාර සහ කෘෂි සංවිධානය බහු පාක්ෂිකව හා ද්විපාක්ෂිකව බාහිර මුදල් ආයතන සමග සහයෝගයෙන් ගොවිකටයුතු ප්‍රතිසංස්කරණ හා ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතීන් හඳුනා ගැනීම, සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ

සමීක්ෂණය සම්බන්ධයෙන් එහි කටයුතු කරන අතර, සාමාජික රටවල් ඉල්ලූ විට ඒවාට ද අනිත් ඒවායේ දේශීය හැකියාවන් ශක්තිමත් කර ගැනීමට ආධාර වෙයි.

(iii) අන්තර් ජාතික මුදල් අපනයනය ආහාර හා කෘෂිකර්ම සංවිධානය සමග සහයෝගයෙන්, සාමාජික රටවල ඉල්ලීම පිට ග්‍රාමීය සංවර්ධනය සඳහා ආයෝජන වැඩ සටහන් පුළුල් කිරීමට සැළකිය යුතු අන්දමින් ඕනෑ කරන රටවල් සඳහා ආධාර දෙන්නන් සහ ලබන්නන් අතර සාකච්ඡා සංවිධානය කිරීමට උදව් වේ.

(iv) ආහාර හා කෘෂිකර්මසංවිධානය හා එක්සත්ජාතීන්ගේ පද්ධතියේ වෙනත් සංවිධානයන් ද අන්තර් රාෂ්ඨීය ග්‍රාමීය සංවිධාන ව්‍යාපෘතීන් දියුණු කිරීම සඳහා සංවර්ධනය වන රටවල් අතර ආර්ථික සහයෝගය පහසු කරවයි.

සටහන - ප්‍රතිපත්ති ප්‍රකාශන හා කාර්ය වැඩසටහන, ඇතැම් නිශ්චිත විධිවිධානයන් සම්බන්ධයෙන් සමහර රටවල් පමණක් එකඟතාවයෙන් තොරව, අන් සියල්ලන්ගේ එකඟතාවයෙන් අනුමත කරන ලදී.

මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය හා කාර්ය වැඩසටහනෙහි ගැඹුරු සදචාරාත්මක බලවේගයක්තිබිය යුතු අතර, එහි දැක්වෙන අරමුණු ඉටු කරගැනීමේ අවශ්‍යතාව නොතකා හැරීම සෑම කෙනෙකුගේම අනතුරට හේතු වනු ඇත.

"ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි අප ගොවි කටයුතු ප්‍රතිසංස්කරණය හා ග්‍රාමීය ප්‍රතිසංස්කරණ යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? යන්න පැහැදිලි කර ඇතුවා පමණක් නොව, ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ මූලික අරමුණු ඇති කර ගැනීම සඳහා අප කරන සියලු දැහී, සංකල්පීය හා සදචාරමත්වන හැඩ ගැස්මද සපයා ඇත"

එය මම ගොවි අයිතිය ප්‍රඥප්තිය ලෙස කිසිදු පැකිලීමකින් තොරව හඳුන්වා දෙමි.

**එඩුවාර්ඩ් සවුමා**
අධ්‍යක්ෂ ජනරාල්,
එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය

9093

22045

# ස්තුතිය

ගොවි පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම හා ග්‍රාමීය සංවර්ධනය පිළිබඳව 1979 දී පවත්වන ලද සම්මන්ත්‍රණයේදී සකස් කරන ලද මෙම ප්‍රඥප්තිය මෙවර "ගොවි දිනය" වෙනුවෙන් මෙසේ ප්‍රකාශයට පත්කිරීමට අවසර දුන් මෙම ආයතනයේ පාලක මණ්ඩලයටත් එය සිංහලයට පෙරලා දුන් ඩී. ඇස්. මායාදුන්න මහතාටත් ඔහුට සහාය දුන් මාලින්ද සෙනෙවිරත්න මහතාටත්, ආචාර්ය පියසිරි කරුණාතිලකටත්, ගාමිණී වික්‍රමසිංහ මහතාටත් අපගේ ස්තුතිය හිමිවේ.

| | | |
|---|---|---|
| කළවනාකරණය | : | ප්‍රසෙන්ජිත් තෙන්නකෝන් |
| පරිගණක අකුරු සැකසුම | : | අජිත් ජයමාන්න |
| මුද්‍රණය | : | කෝවිස් ප්‍රින්ටර්ස් |

පිට කවරය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක් ආශ්‍රයෙන් ප්‍රදීපිකා නානායක්කාර විසින් සකස් කරන ලදී.

22045